භක්ති ප්‍රබෝධනය
පවුලේ සඟරාව

# භක්ති ප්‍රබෝධනය

එකසිය විසිපස්වසක් ඉක්මවූ නොනවතින යුග මෙහෙවර

2024 සැප්තැම්බර් - ඔක්තෝම්බර් | 125 වන කාණ්ඩය - 05 කලාපය | පිටු 32 | DOP/NEWS/01/2024

## නායකත්වය



ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාව

ආරම්භය 1899

# මගේ ලෝකයේ වීරයා

ගී පද - අසෝක හඳගම
තනු නිර්මාණය - කපිල පූගලආරච්චි
ගායනය - නෙළු අධිකාරි, කපිල පූගලආරච්චි සහ පිරිස



වීරකතාවල නිසොල්ලාසවල
අන්ධකාරයේ සිනමාපටවල
පීර පීර මං හෙව්වා
මගේ ලෝකයට වීරයෙක්

ඉර ගිනි ඇවිළී ලේ පැහැ ගැන්වී
ප්‍රාර්ථනාවන් ගිනිගත් සවසක
දුවිලි නගරේ දෙනෝදහක් මැද
ඔබේ හඬ ඇසෙන තුරා

සුපර්මෑන්ලා ස්පයිඩර්මෑන්ලා හැරී
පොටර්ලා - වීරයෝ වුණා අපේ

නෙක දුක් ගැහැටින් හෙම්බත් වුවත්
ජීවිතයේ වෙර අත්නොහරන දන
තරම් වීරයන් තවත් කොහේවෙද
සිහින් හඬින් ඔබ කියනා තුරුමත්

සුපර්මෑන්ලා ස්පයිඩර්මෑන්ලා හැරී
පොටර්ලා - වීරයෝ වුණා අපේ

නටබුන් වීදිය ගල්කණු අද්දර
වංශ කතාවල අකුරු පේළි යට
වල්බිහිවී ගිය ප්‍රාර්ථනාවට
දළුලා වැඩෙන්න ඉඩදෙන්න

දස අත සෙව්වත්
මුණ නොගැසී ගිය
තමන්ගේ ලෝකයේ සැබෑ වීරයා
තමා තුළම හඳුනා ගන්න ///

අප දිවි ගෙවන්නේ දූෂිත දේශපාලක නායකයන් 'වීරවරයන්' ලෙස පිදුම් ලබන රටක ය. නළුවකුට, ක්‍රීඩකයකුට පමණක් නොව, පාතාල නායකයකුට හෝ මිනීමරුවකුට වුවද පාර්ලිමේන්තු ගොස් මුළු රටක් වෙනුවෙන් නීති සම්පාදනය කළ හැකි යැයි විශ්වාස කරන ජනතාවක් සිටින රටක ය. අශෝක හඳගම සූරීන් විසින් අධ්‍යක්ෂණය කළ, 2010 වර්ෂයේදී තිරගත වූ '<u>විදූ</u>' ළමා චිත්‍රපටියේ එන මේ ගීතයෙන් සැබෑ නායකයා, සැබෑ වීරයා හඳුනා ගැනීමට අපව උත්සුක කරවන්නේ එවන් පසුබිමක් ය.

කුඩා දරුවන්ගේ පුංචි ලෝකය තුළ ඔවුන්ගේම පියා හෝ මව සිය වීරවරයන් බවට පත්වන අවස්ථා සුලබ ය. ඇතැම් විට පාසැලේ සිය ඇදුරුතුමා හෝ ඇදුරුතුමිය තුළද ඒ පරමාදර්ශී චරිතය දැක ගන්නට ඔවුනට හැකියාව ලැබේ. එහෙත් ඒ දරුවා යොවුන් විය එළැඹි පසු, අනුසාර කිරීමට තරම් සුදුසු, මනා පෞරුෂයකින් හෙබි නායකත්වයන් අවට සමාජයේ දක්නට ලැබෙනවාද යන්න සැක සහිතය. එබැවින්, "<u>සුපර්මෑන්ලා ස්පයිඩර්මෑන්ලා හැරී පොටර්ලා</u>" ඔවුන්ගේ වීරයෝ වීම වැළැක්විය නොහැකිය.

එහෙත්, "<u>නෙක දුක් ගැහැටින් හෙම්බත් වුවත් ජීවිතයේ වෙර අත්නොහරින</u>", ධෛර්යයෙන් ශක්තියෙන් දිවිගෙවන සැබෑ නායකයන් දෙස බලා ජීවිතය ඉගෙනගත යුතු කාලයක් දැන් එළඹ තිබේ. සැබෑ නායකයා ආදර්ශවත් චරිතයකි. තමාට වඩා අනිකාගේ යහපත පතන්නෙකි. බලාපොරොත්තු සුන්වූ තැනට බලාපොරොත්තුව රැගෙන එන්නෙකි. "<u>වල්බිහිවී ගිය ප්‍රාර්ථනාවන්ට දළුලා වැඩෙන්නට</u>" ඉඩහරින්නෙකි. එවන් නායකයන් සිටින්නේ කොහේද...?

ගීත රචකයාගේ පිළිතුර ඉතා ගැඹුරුය. ඔහුගේ ආරාධනය, "<u>තමන්ගේ ලෝකයේ සැබෑ වීරයා, සැබෑ නායකයා තමා තුළම</u>" හඳුනා ගැනීමටය.

දස අත සෙව්වත් - මුණ නොගැසී ගිය
තමන්ගේ ලෝකයේ සැබෑ වීරයා
තමා තුළම හඳුනා ගන්න ///

**ගරු ශානිල් දිනුක ජයවර්ධන නිමනි පියතුමා**
**අධ්‍යක්ෂ, 'මැසනඩ් යොවුන් පියස', සා. විසෙන්ති නිවාසය, මග්ගොන.**

# ශක්ති ප්‍රබෝධනය

2024 සැප්තැම්බර් - ඔක්තෝබර්


**ප්‍රකාශනය**

නිර්මල මරිය නිකාය

**භාරකරු**

අතිගරු රොෂාන් සිල්වා නි. ම. නි. පියතුමා
නිර්මල මරිය නිකායික ප්‍රාදේශාධිපති
කොළඹ ප්‍රාදේශිකය

**සංස්කාරක**

ගරු එමාඩ් දල්පතාදු නි. ම. නි. පියතුමා

**සංස්කරණ සහාය**

රූපස් ප්‍රැන්සිස්
ටී. සුනිල් ප්‍රනාන්දු
පිලීෂන් අබයකෝන්

**කවරය නිර්මාණය**

අචල රූපසිංහ

**පරිගණක පිටු සැකසුම**

ආනන්ද නාගහගේ

**මුද්‍රණය**

කතෝලික මුද්‍රණාලය
කොළඹ 08.


## පිටුවෙන් පිටුව..........


2 කවරයේ කථාව

3 හෙළිදරව්ව

5 දිවැසිවරයකුගේ හඬ ...
නෝබට් ඇම්. අන්ද්‍රාදි රදගුරු හිමිපාණෝ

7 සුහද ආරාධනා වසර 125 ජුබිලි සැමරුම

8 අපේ නායකයන් කොයිබටද ?
කලාභූෂණ කැලිස්ටස් ජයමාන්න

9 පිළිගමු වැඳලා දෝතින්
පී. ඩබ්ලිව්. සුනිල් ප්‍රනාන්දු

10 මනා පෞරුෂයකින් ... - බී. රූබි රුද්‍රිගු

12 2025 ජුබිලි ... - ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා

15 පන්හිඳේ මෙහෙවර නිවී ... - රූපස් ප්‍රැන්සිස්

16 නායකයෝ - ගරු සුමිත් සමීර සහෝදරතුමා

17 සැප විතරයි දුක නොදනී - ඩිලීෂියා තිලකරත්න
උස් මිටි කම් ... - මනුක වීරසේකර

18 කෙටිකතාව - ඇග්නස් චන්ද්‍රකාන්ති

20 අපට හිතැති නායකයෝ - අයිරින් කොස්තා

21 කාව සිත - චමත් බී. පයාගල
අමිතගේ හද ගැස්ම - සී. අමිත

22 The Power Of Life - Christopher Perera

24 සේවකත්වයේ නායකයා ... - බෙනී ජයමාන්න
යක්ෂ සැලැස්ම - සපුගස්කන්දේ රංජිත්

25 ඕං එහෙනං - සූරිය මාමා

26 පුංචි විකුම් - තරු නැන්දා

27 ප්‍රහේලිකා අංක - 81
ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා

28 ප්‍රහේලිකා අංක 79 පිළිතුරු

29 අ. පො. ස. (සා. පෙළ) ආදර්ශ ප්‍රශ්න පත්‍රය II
ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය

31 අ. පො. ස. (උ. පෙළ) ක්‍රිස්තියානි ධර්මය ...
එස්. හේමාල් පෙරේරා

32 කුසගින්නට නොව ... - අනුෂ්ක රනික්

# භක්ති ප්‍රබෝධනය

වසර 1899 සිට අඛණ්ඩව එළිදක්වන භක්ති ප්‍රබෝධනය ශ්‍රී ලංකාවේ පළවන ඉපැරණිම සිංහල සඟරාවයි. භක්ති ප්‍රබෝධනය නිර්මල මරිය නිකායේ කොළඹ ප්‍රාදේශිකයේ භාරකාරත්වය යටතේ පළවන ප්‍රකාශනයකි. (නි.ම.නි.)

Bhakthi Prabodhanaya, Published continuously since 1899, is the oldest Sinhala magazine in Sri Lanka. Bhakthi Prabodhanaya, is owned and published by the Colombo Province of the Oblates of Mary Immaculate. (O.M.I.)




## කවරයේ කථාව

වගකීමක් වන නායකත්වය, බලයක් යැයි ඇතැමුන් සිතීම නොරහසකි. වත්මන් සමාජීය පසුබිම තුළ සුලබව දක්නට ඇත්තේ, සුදුස්සා නායකත්වය ප්‍රතික්ෂේප කරත්ම නුසුදුස්සා එයට පොරබැදීමත් එය අවභාවිත කිරීමත්ය. එය සමස්ත දේශයේම විනාශයට හේතුවක් නොවන්නේද? මෙවන් තත්ත්වයක මෙවර කවරයේ කථාව අප කැඳවන්නේ උතුම් පරමාදර්ශී නායකත්වයේ ප්‍රතිමූර්තිය වන ප්‍රතාපවත් ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ දෙස නෙත් සිත් අයා, පිපාසාවෙන් පෙළෙන්නන් උල්පත් කරා රැගෙන යන, අඳුරේ සිටින්නන් ආලෝකය වෙත කැඳවන, සේවකත්වය පෙරටුකරගත්, ශුද්ධ ප්‍රාර්ථනාකාමී සිතුවිලි දරා සිටින යහපත් එඬේරික නායකත්වයක් දැරීමට නොපසුබට වීමටත්, එවන් නායකත්වන්ට සවියක් වීමටත්ය.

අචල රූපසිංහ


## භක්ති ප්‍රබෝධනය

දායකත්වය එක් වසරකට - රු. 850.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

දායකත්වය වසර දෙකකට - රු. 1700.00 (මුද්දර ගාස්තුව ද ඇතුළුව)

සියලුම ලිපි, දායකත්ව මුදල් හා විමසීම් මේ ලිපිනයට යොමු කරන්න.

සංස්කාරක පියතුමා.
"භක්ති ප්‍රබෝධනය"
265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.
දුරකතන : 0112 698 177
විද්‍යුත් තැපැල : bhakthi.prabodhanaya@gmail.com
වෙබ් ලිපිනය : bpomi.org

## BHAKTHI PRABODHANAYA

Rs. 850.00 for a year (Including Postage)

Rs. 1700.00 for two years (Including Postage)

All articles, subscriptions and inquiries should be sent to this address.

Editor.
"Bhakthi Prabodhanaya"
265, Deans Road, Maradana,
Colombo 10, Sri Lanka
Tel. : 0112 698 177
Email: bhakthi.prabodhanaya@gmail.com
Web Address : bpomi.org

# හෙළිදරව්ව

# නායකත්වය

තම බුද්ධියෙන් සහ ප්‍රඥාවෙන් විධිමත් හෝ අවිධිමත් අයුරින් ගත් දැනුම සහ ප්‍රායෝගික අත්දැකීම් හරහා කිසියම් කෙනකුව හෝ කණ්ඩායමක් නිවැරදි හෝ වැරදි දිශානතියකට මෙහෙයවන්නා නායකයකු හෝ නායිකාවක ලෙස හඳුනා ගත හැකිය.

නායකයකු හදනවාට වඩා නායකයන් බිහිවීම සමාජ යථාර්ථයක් ලෙස ඕනෑම සමාජ තලයක දැක ගත හැකිය. සමාජීය, ආගමික, දේශපාලන, සංස්කෘතිමය, විද්‍යාත්මක ආදි විවිධ ක්ෂේත්‍රවල විවිධ නායක නායිකාවෝ අපට හමුවෙති. දස දහස් ගණන් නායකයන් අතර නාසරතයේ ජේසුස් ක්‍රිස්තුස් වහන්සේ අසමසම නායකයෙකි. එදා ගලීලයේ මුහුදු බඩ ඇවිදිමින් ධීවරයන් කැඳවමින් "මා අනුව එන්න" (මතෙව් 4:19) යැයි පවසමින් සාමාන්‍ය මිනිසුන් දොළොස් දෙනෙක් තෝරා ගෙන තම ප්‍රථම අනුගාමිකයන් ලෙසින් ඔවුන්ව ජේසුස් වහන්සේ තෝරාගත් සේක. මීට වසර 2000 ට පමණ පෙර ගලීලයේදී ඉතා සරල අයුරින් ශ්‍රාවක සංඝය ආරම්භ කළත් ජේසුස් වහන්සේගේ නායකත්වය උන්වහන්සේම පවසන ආකාරයට, අනුක්‍රමයෙන් අබ පැලයක් සේ වැඩෙන්නට විය. එදා ආරම්භ කළ ඒ සරල නායකත්වය දෙස අද ආපසු හැරී බලන විට රොද බැඳගත් කෝටි සංඛ්‍යාත ජන ගඟක් ජේසුස් වහන්සේගේ අනුගාමිකයන් වූවා පමණක් නොව තම ජීවිතයේ ගැලවුම්කරුවාණන් ලෙස පිළිගෙන සම්පූර්ණ ජීවිත රටාව උන්වහන්සේ වෙනුවෙන් වෙනස් කර ගෙන ජීවත් වන්නට හෝ ප්‍රාණ පරිත්‍යාගි වන්නට විවිධ තාඩන පීඩන මැද්දේ පවා ඉදිරිපත් වූ බවට ඉතිහාසය සාක්ෂි දරයි. ජේසුස් වහන්සේගේ නායකත්වයේ ප්‍රතිරූපය උන්වහන්සේ තම ජනතාවට හෙළිදරව් කළ සේක.

"මම යහපත් එඬේරා වෙමි. යහපත් එඬේරා තම ජීවිතය බැටළුවන් උදෙසා පුද කරන්නේය" (ජොහන් 10:11).

ජේසුස් වහන්සේ කුලී එඬේරකු ගැනද මෙහිදී අවධානය යොමු කරයි.

"බැටළුවන්ගේ අයිතිකාරයා නොවන කුලීකාරයා වෘකයා එනු දැක බැටළුවන් හැර දමා පලා යන්නේය. ඔහු පලා යන්නේ ඔහු කුලීකාරයකු වන නිසාත් බැටළුවන් ගැන සැලකිල්ලක් ඔහුට නැති නිසාත් ය" (ජොහන් 10:12-13). ජුදයාව ගල් සහ කඳු සහිත ප්‍රදේශයකි. එහි ගොවිතැනට වඩා බැටළු පාලනය එදා ජනප්‍රියය. බැටළුවන් බොහෝ විට ඇති කළේ කිරි සහ ලොම් සඳහාය. පොරෝනා සහ කූඩාරම් තැනීමටද මිනිසුන් ලොම් භාවිත කළහ. බැටළුවන් සහ එඬේරා අතර පවතින්නේ ඉතාම කුලුපග සබඳතාවකි. බැටළුවා යනු සතුන් අතර දුර්වල සතෙකි. යහපත් එඬේරා හැමවිටම බැටළුවාව ආරක්ෂා කරන්නට පියවර ගත්තා පමණක් නොව තම බැටළුවන් වෙනුවෙන් ජීවිතය වුවත් පරදුවට තබා කටයුතු කළේය. බැටළුවන්ව සාරවත් තණ බිම් සහ පිරිසිදු දිය දහරාවලට ගෙන ගියේය. උන්ව සතුරන්ගෙන් ආරක්ෂා කළෝය. එහෙත් කුලී එඬේරා තම බැටළුවන්ගේ අයිතිකරුවා නොවන නිසා ඔහුට බැටළුවන් සම්බන්ධව කැක්කුමක් නොමැත. එබැවින් කුලී එඬේරාව ජෙරමියස් දිවැසිවරයා උපමා කරන්නේ අධර්මිෂ්ඨ ලෙස කටයුතු කරන, ව්‍යාජ ආගමික නායකයන්ටය. මේ අයට දිවැසිවරයා බරපතළ ලෙස චෝදනා කළේය (ජෙරමියා 23 පරිච්ඡේදය පරිශීලනය කරන්න). ක්‍රිස්තු නායකත්වය වර්තමානයේදී ද ඕනෑම ක්ෂේත්‍රයක නායකයන් වීමට බලාපොරොත්තු වන්නන්ට මෙන්ම නායකත්වයේ සිටින්නන්ට පරමාදර්ශී, විශ්වීය නායකත්වයක් ලෙස ඕනෑම කෙනකුට අවිවාදයෙන් පිළිගත හැකිය.

"ඔබ අතර යමෙක් නායකයා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ සේවකයා වන්නේය. ඔබ අතර යමෙක් ප්‍රධානියා වන්න කැමැත්තේ නම් ඔහු ඔබේ දාසයා වන්නේය. මනුෂ්‍ය පුත්‍රයාණන් වැඩියේ සේවය ලබන්න නොව සේවය කරන්නටත් බොහෝ දෙනකුගේ මිදීම උදෙසා සියදිවි පිදීමටත් ය" (මතෙව් 20:26-28).

ක්‍රිස්තුන් වහන්සේ සැබෑ නායකත්වය කුමක්ද යන්න තම ජීවිත ආදර්ශය තුළ සැබැවින්ම පෙන්නුම් කළ සේක. කුරුසියේ මරණයට පෙර දවසේ අවසාන රාත්‍රි භෝජනයෙන් පසු තම ගෝලයන්ගේ

පාද ධෝවනය කරමින් නායකත්වය හැසිර විය යුතු අයුරු කදිම ජීවිත ආදර්ශයක් සහ ප්‍රේමයේ මිනුම් දණ්ඩක් එක් කළ සේක. "ඔබේ ස්වාමින්ද ගුරු දේවයන් ද වන මම ඔබේ පාද සේදුවේ නම් ඔබත් එකිනෙකාගේ පාද සේදිය යුතුය මා ඔබට කළාක් මෙන් ඔබත් කළ යුතු බවට ආදර්ශයක් මම දුනිමි" (ජොහාන් 13: 14-15).

වර්තමාන සමාජය දෙස බලන විට මෙවන් ආදර්ශවත් නායකත්ව විරලය. එසේ නම් අපට දැක ගත හැක්කේ මොනවාද ? විවිධ ක්ෂේත්‍රවල ඒකාධිපති, දරදඬු, අධර්මිෂ්ඨ, අසංවේදී, ජනතාව මුළා කරන, කුරිරු නායක නායිකාවෝ බහුලය. අද අපට හමුවන නායික නායිකාවන් ඇත්තෙන්ම නායකත්වයට සුදුසුද යන්න කල්පනා කළ යුතුය. බොහෝ දෙනකු කටයුතු කරන්නේ, සමාජයේ ප්‍රගතියට නායකත්වයක් දෙනවාට වඩා තමන්ගේ පැවැත්ම, සුබවිහරණය, තම කුටුම්බය ගොඩ නගන්නට, අපරාධ කළ උදවියව ඇතැම් විට ආරක්ෂා කර ගන්නට, තමන්ට වාසි ලාභ ගෙනෙන අයව තානාන්තර දී රඳවන්නට උත්සාහ කිරීමටය. ජාතිය, ආගම්, කුල ඇතුළු ඕනෑම බෙදීමක් ඇති කර ජනතාව බෙදා කොටවමින් නායකත්වය ගන්නට නොකරන දෙයක් නැත.

ඔවුන් නායකත්වය නමින් ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ නිසා බොහෝ විට අසරණයෝ, පීඩිතයෝ, දිළින්දෝ, නූගත්තු, සූරා කෑමට ගොදුරුවන්නෝ, කබලෙන් ලිපට හෝ ප්‍රපාතයකටම ඇද වැටෙති. මෙවන් සන්දර්භයක ක්‍රිස්තුන් වහන්සේගේ නායකත්වය ආධ්‍යාත්මික වුවත් ලෞකික නායකත්වයකට වුවද සෘජුවම බලපාන්නකි. ක්‍රිස්තු නායකත්වයේ ඇතැම් අසමසම ලක්ෂණ වන්නේ;

- ජීවිතයේ අරුත මනාව තේරුම් ගත් නායකයෙකි.
- දූරදර්ශීභාවයක් හෙවත් විචක්ෂණයක් තුළ ගමනක් ගිය නායකයෙකි.
- අන් අයව දිරිමත් කරමින් මංමුළා වූ අයට මඟ පෙන්වා ගලවන නායකත්වයකි.
- හතුරන්ට පවා මරණ මොහොතේදීත්, සමාව දුන් නායකයෙකි.
- කැපවී, වැයවී අවසානයේදී තම ජීවිතය ජනතාව වෙනුවෙන් පූජා කළ නායකයෙකි.
- සිය දේශනා සහ ඉගැන්වීම් තම ජීවිත ආදර්ශය තුළින් ප්‍රායෝගික කළ නායකයෙකි.
- තමකම නසමින් කුරුසිය දරාගෙන තමන් වහන්සේ අනුව එන්නට සිය අනුගාමිකයන්ට ආරාධනා කළ නායකයෙකි. එනම් විනයක් ඇතිව, සියලු අපහසුතා දුෂ්කරතා හමුවේ වුවද වඩා යහපත් දේ සඳහා ඒවා විඳදරා ගත යුතු බව පෙන්නුම් කරදුන් නායකයෙකි.
- සාධාරණත්වය, යුක්තිය උදෙසා හඬ නැංවූ අහිංසක, අසරණයන්, පව්කාරයන්, රෝගීන්ව, නිදහස් කර ඔසවන්නට හැමවිටම ක්‍රියාකාරී වූ නායකයෙකි.
- පැවතුණ සමාජ ක්‍රමය සහ මිනිසුන්ව තළන පෙළන පුහු ආගමික පිළිවෙත් සහ සම්මතයන් විවේචනය කරමින්, එය වෙනස් කරන්නට අවිහිංසාවේ සහ ප්‍රේමයේ විප්ලවයක් කළ නායකයෙකි.

රජ්ජුරුවෝ උඩයි උඩයි, රට වැසි අපි බිමයි බිමයි වැනි වහල් මානසික තත්ත්වවලින් ඇතැම් පුරවැසියන්ට තවමත් මිදෙන්නට බැරිය. එවන් කාලයක අවංක නායක නායිකාවන් අද පෙරට වඩා අප සමාජයට වුවමනා වී ඇත.

වර්තමාන ෆ්‍රැන්සිස් ශුද්ධෝත්තම පියාණන් සංගමනශීලී සභාවක් පිළිබඳව දේව ජනතාවට ඉදිරිපත් කර ඇත. මෙතුවක් කල් පැවතුණ පිරමිඩ නායකත්වයට (△) වඩා සියලු දෙනාම එකට එක්ව (Walking Together) ගමන් කරන නායකත්ව ක්‍රමවේදයක් පිළිබඳව මෙහිදී අවධාරණය කර ඇත. මේ ස්වභාවය මුල් කිතුනු සංඝය තුළද දැකිය හැකි නායකත්වයකි.

ක්‍රිස්තු නායකත්වයේ සැබෑ ස්වභාවය අවබෝධ කරගෙන ඒ සඳහා අවතීර්ණ වන තරමටම පවතින ගැටලු රාශියකට සැබෑ විසඳුම් ඇත. එවන් නායකත්වයක් කතෝලික සභාවට පමණක් නොව දේශපාලන ලෝකයටද අනිකුත් හැම ක්ෂේත්‍රයකටද අත්‍යවශ්‍ය වන බව සැම දෙනාම පාහේ අවබෝධකර ගත යුතුය. එවන් පරමාදර්ශී නායකත්වයකින් තොරව මේ දේශය ගොඩ නගාලීමට සිතීම පවා මායාවකි. සැබෑ නොවන සිහිනයකි.

**සංස්කාරක පියතුමා**

# දිවැසිවරයකුගේ හඬ ...

**2024 මාර්තු 02 වන සෙනසුරාදා, හලාවත ආසන දෙව්මැදුරේදී, රදගුරු අභිෂේක පදවි ප්‍රාප්ති දේව වන්දනා මෙහෙයේදි, අනුරාධපුර රදගුරුතුමන් විසින් කරන ලද දේශනාවයි මේ.**

රදගුරුවර අපේක්ෂක ගෞරවනිය සහෝදර පූජා ප්‍රසාදි තුමනි, සෙසු සහෝදර රදගුරු හිමිපාණනි, ගරු පූජා ප්‍රසාදින් වහන්ස, පැවිදි සහෝදර සහෝදරියනි, සැදැහැවතුනි, ආදර දූ පුතුනි,

■ **ප්‍රවිෂ්ටය**

හලාවත රදගුරු වසමේ එඬේරික නායකත්වයට අප සහෝදර පූජාප්‍රසාදිතුමකු පත් කරනු ලබන උත්කෘෂ්ට වූ අවස්ථාවට අප මහත් සන්තුෂ්ටියෙන් හා සතුටින් එක් රැස්වී සිටිමු. කාලයක් තුළ අප කවුරුනුත් අපේක්ෂා කළ මේ අවස්ථාව වෙනුවෙන් අප දෙවි සමිඳුන් හට ස්තුති ප්‍රශංසා කරමු. මුලිකවම අප සැම දෙන බැහැපත් සිතින් දේව වචනය වෙත යොමු වී එය තුළ අප සමිඳුන්ගේ මග පෙන්වීම ප්‍රාර්ථනා කරමු.

■ **කැඳවනු ලබන කිතුනු නායකත්වය**

තමන් අතරේ නායකයා වන්නේ කවුරුන්ද යන්න පිළිබඳව අර්බුදයක් පැන නැගුණ අවස්ථාවකදී සිය ශ්‍රාවකයනට, ජේසු සමිඳුන්ගේ ආයාචනය වුයේ: "ඔබ අතුරින් නායකයා වන්නට කැමැත්තේ සියල්ලන්ගේම සේවකයා වේවා" යන්නයි (මතෙව් 20:25-28, ලූක්: 22:24-27) සේවය ලැබීම මිනිස් ස්වභාවය තුළ අප කාටත් වඩා පහසු වුවත් සේවකයකු වීම අපට නිතැතින්ම සිදුවන්නක් නොවන බව අපි දනිමු. ජේසුස් වහන්සේගේම ආදර්ශය වෙත යොමුවෙද්දී, විශේෂයෙන් ශුද්ධ වූ ලූක් තුමා පවසන පරිදි පියාණන් වහන්සේ හා දීර්ඝ යාච්ඤාව තුළ එය ඉටුකළ බව පැහැදිලි වේ. උන්වහන්සේට මුහුණ දෙන්නට සිදු වූ විශාලම අභියෝගයට ද (ශ්‍රී කුරුසයේ මරණය), උන්වහන්සේ මුහුණ දුන්නේ ගැඹුරු යාච්ඤාව තුළ බවත්, ඒ තුළත් ගැබ්වී තිබුණේ පියාණන් වහන්සේගේ අභිමතය තම අභිමතය අබිබවා ක්‍රියාවට නැංවීමය. එයට අවනත වීමේ අභිලාෂයෙන් උන්වහන්සේ ක්‍රියා කළ බවයි.

පළමු දේව ප්‍රකාශනය : නායකත්වයට කැඳවන දෙවි සමිදාණෝ.

අද අපි සවන් දුන් මීකා දිවැස් ප්‍රසාදිවරයාගේ වචනයෙන් (මීකා 7:14-15,18-20) රදගුරු වසමේ එඬේරික නායකත්වයේ වගකීම් තමන් භාර ගන්නාවූ, තමන් හට ඒ වගකීම් පවරා දෙන්නා වු දෙවි සමිදාණන්ගේ ස්වභාවය අපට පැහැදිලි කරයි. " රැළට එඬේරකුගේ කෙවිටෙන් මෙන් මග පෙන්වන්න." පසුගිය අපරාධ මකා දමන, උදහස සදහටම තබා නොගන්නා, මුහුදේ පත්ලට මෙන් අපගේ පව් හෙළා දමන, ආබ්‍රහම්, ජාකොබ් වැනි ආදි පිතෘවරුන් හට මෙන් අප කෙරෙහි විශ්වාසවන්ත වන දෙවි කෙනෙක් පිළිබඳවයි අපට කථා කරන්නේ.

දෙවන දේව ප්‍රකාශනයः ශු. පේදුරුතුමන්ගේ අනුශාසනය හා එහි වගකීම.

ඉන් ඉක්බිති අද දෙවන දේව ප්‍රකාශනය (පේදුරු 5:1-4) තුළ අපට ඉදිරිපත් කෙරෙන්නේ ශුද්ධවූ පේදුරු තුමන්ගේ අනුශාසනාත්මක වචනයි " ඔබට බාර දෙන ලද රැළ පෝෂණය කරන්න. ඔවුන්ට සතුටු සිතින් දේව කැමැත්ත අනුව එසේ කරන්න. ආධිපත්‍යය පැමෙන් වැළකී රැළට ආදර්ශයක් වන්න" එය එක් පුද්ගලයකු වන රදගුරුතුමාට පමණක් කරන ඉල්ලීමක් නොවේ. පේදුරු තුමන් සිය ලිපියේ එය සඳහන් කරන්නේ ඔබ අතර සිටින සභා මුලිකයන් හට කරන ඉල්ලීමක් ලෙසයි. එක් පුද්ගලයකු පමණක් වන රදගුරුතුමා බල සම්පන්න, ශක්ති සම්පන්න වන්නට නම් ඒ සඳහා අත්‍යාවශ්‍ය කාරණයක් වෙත අපගේ අවධානය යොමු වේ. රැළ පෝෂණය කිරීම, සතුටු සිතින් ලැදියාවෙන් සේවය කිරීම, ඔවුනට ආදර්ශයක් වීම තනි පුද්ගලයකුගේ කාර්යයක් නොවන බව පහදා දෙන පේදුරුතුමාණෝ ඒ කර්තව්‍යය එකමුතුව සාංඝික කාර්යයක් ලෙස ඒකරාශී ව කළ යුතු බව අවධාරණය කරති. එය රදගුරු වසමේ පූජක, පැවිදි සහ ගිහි සැමට පැවරෙන බරපතළ වගකීමකි. එක්සත්ව සමගි සම්පන්නව වත්මන් සභාව ආරාධනා කරන පරිදි ගිහි සැදැහැවතුන් සමඟ එය කළ යුතුවේ. ඒ අනුව ගිහි, පූජක, පැවිදි වශයෙන් බෙදී සිටින්නට, විරසකව සිටින්නට සහෝදරත්වයෙන් දයාවෙන් තොරව සිටින්නට අපට කිසිවිටක අවසර නැති බව අපි ධාරණය කර ගනිමු. අප එකිනෙකාගේ පෞද්ගලික මතිමතාන්තර තුළම රැඳී නොසිට ජේසු සමිදාණන්ගේ ශ්‍රී නාමයෙන්ම එකිනෙකාට දයාව

පාමින්, සමාව දෙමින්, ඒකරාශීව, සාංඝිකව අප කටයුතු කළ යුතු බව සිත්හි ධාරණය කර ගනිමු. එසේ කළහොත් **පමණක්** දේව රාජ්‍ය **ගොඩනගන්නට** තවදුරටත් ඉදිරි ගමනක් යන්නට අපගේ ළමා හා තරුණ දූ පුතුන් සමග අපට වැඩි දියුණු වන්න හැකිවන බව අප අවබෝධ කරගනිමු.

සුවිශේෂයඃ කානාහි විවාහ මංගල්‍යය හා දේව මාතාවන්ගේ ඉල්ලීම.

රදගුරු අපේක්ෂක අප පියතුමා විසින්ම තෝරා ගනු ලැබූ ශුද්ධ වූ සුවිශේෂ පාඨයෙන් ද (ජුවාම් 2ඃ 1-12) කානානි විවාහ මංගල්‍යය වෙත අපගේ අවධානය යොමු කරනු ලැබේ. පරිශුද්ධ දේව මාතාවන් කානාහි විවාහ මංගල්‍යය උළෙලේ අමුත්තියක පමණක් නොවේ. (She was not a mere guest at the wedding) තමන් ජේසු සමිඳාණන් අනුව යමින් අන් අය ද අනුගාමිකත්වයට කැඳවනු ලැබිය යුතු ආරාධනය කානාහි දී පමණක් නොව සමස්ත සභා ඉතිහාසය තුළ ද ඇය පෙන්නුම් කළාය. දේව ජනතාවගේ අවශ්‍යතාවලට, දුකට වේදනාවට නායකයා සංවේදී වීම කිතුනු නායකත්වයෙන් අපේක්ෂා කරයි. ඒ අනුව එදිනෙදා මුහුණ දෙන වේදනාවලට, අවශ්‍යතාවලට සංවේදී නොවීම. ප්‍රතිචාර නොදැක්වීම නායකත්වයේ දුර්වලකමක් ලෙස පෙනෙනු ඇත. රදගුරු වසමේ ධීවර ජනතාවගේ ද ඇත එපිට විසිරී සිටින දිළිඳු අයගේ ද එදා "ගල් භාජන" වලට වතුර වක්කළාක් මෙන් අප කළ යුතු දේ කිරීම, ඉතිරිය දෙවි සමිඳුන්ටම බාර කිරීමට නායකත්වය බාර ගන්නා අප සැම කළ යුතු වේ.

පරිශුද්ධ දේවමාතාවන්ගේ ආයාචනය වූයේ "උන්වහන්සේ ඔබට කියන කොයි යම් දෙයක් හෝ ඉටු කරන්න" යන්නයි. අප කළ යුතු දේත් අපට තවදුරටත් පෙන්වා දෙත්වා යන ඉල්ලීමෙන් සැදී පැහැදී අප නිතරම එසේ යාච්ඤා කරමු. අප රටෙහි සැම ක්ෂේත්‍රයක් තුළම වගේ පවතින බලවත් අවිනිශ්චිතභාවය තුළ දෙවියන් වහන්සේගේ ඒ බලවත් ආයාචනය සමග රදගුරුවරය තුළද ඔබ කළ යුතු දේ තෝරා බේරා ගැනීමට ද, රදගුරුවරය තුළ සෙසු සහායකයන් සමග එසේ කිරීමට ද ඔබට වරම් ලැබේවා යි අපි යාච්ඤා කරමු.

■ දේව රාජ්‍යය ගොඩ නැගීමේ අභියෝගය

"ඔබගේ රාජ්‍ය පැමිණේවා" යනුවෙන් අප දෛනිකව කරන යැදුමෙහි සැබෑ අන්තර්ගතය කුමක්ද යන්න මේ මොහොතේදී තවදුරට අපි අවබෝධ කරගත යුතුවේ. දේව රාජ්‍ය ගොඩනඟනවාය යනුවෙන් අපි භෞතික ස්ථානයක් අදහස් නොකරමු. අප ඉදිකරන ගොඩනැගිලි සංඛ්‍යාවෙන්ම පමණක් එය මිනිය නොහැකිය. අපගේ ජන ජීවිත, අපගේ දෛනික ජීවිත රටාවන්, දෙවියන්වහන්සේගේ කැමැත්තට අනුකූල වන තැන, අපගේ ක්‍රියාකලාපයන් හා දේව කැමැත්ත අතර පරස්පරය විරෝධයක් ඇති නොවන විට, අපගේ ක්‍රියාකලාපයන් දේව අභිමතයට නතුවන විට පමණක් දේව රාජ්‍යය අප අතර ක්‍රියාත්මක වනවා යනුවෙන් අපට සෑහිමකට පත් වන්නට හැකි වන බව සභාවේ විශ්වාසය හා ඉගැන්වීමයි. දේව රාජ්‍යය ගොඩනැගීම, එහි වර්ධනය භෞතික සාධක මිනුම් දණ්ඩකින්ම අපට මිනිය නොහැකිය. ඒ අනුව අප අතර දේව අභිමතය කොයි තරම් දුරට ක්‍රියාත්මක වන්නේ ද යන්න ගැන අපි නිරන්තර විමර්ශනයකින් පසුවිය යුතු වෙමු. අපගේ සේවා කටයුතු සහ දෙවියන් වහන්සේගේ ශුද්ධ වූ කැමැත්ත අතර පරස්පර විරෝධ ඇති නොවන්නට අපි කවුරුත් වග බලා ගත යුතු වෙමු. අපගේ පූජක, පැවිදි හා ගිහි ජනතාවගේ මිනිස්/මානව සබඳතාවල ගුණාත්මක බව මේ කරුණු සැලකිල්ලට ගැනීමේදී අතිශයින් වැදගත් වන බව අපි කල්පනාවට ගනිමු.

■ ගැඹුරු පිරිසිදුවීමක අවශ්‍යතාව

අප වත්මන් දේශයේ බලවත් වංචනික හා දූෂිත බවින් සලකුණු වී ඇති බව අපට රහසක් නොවේ. බලවත් ආර්ථික පීඩාවලින් සමන්විතව. කිසිම මිල පාලනයකට යටත් නැතිව කල් ගෙවන ජනතාවගේ දෛනික වුවමනාවන් ඉදිරියේද, දවසේ ආහාර වේල ඉතා අමාරුවෙන් සපයා ගන්නා දරු පවුල් ඉදිරියේ ද, සෞඛ්‍ය සේවා නිසි අයුරින් ලබා ගන්නට නොහැකිව ඉතාමත් අසරණව සිටින රෝගී අය ඉදිරියේද, ඒ අයුරින් හැම අතකින්ම වගේ බලවත් පීඩාවට පත්වී ඇති ළමා, තරුණ හා වැඩිහිටි මහලු අය ඉදිරියේ ද

අප දේශය හා ජන නායකත්වය අපගේ අනාගත පරපුර හා දූදරුවන් වෙනුවෙන් ඉතා ගැඹුරු පිරිසිදු වීමකට භාජනය විය යුතු බව අපි දනිමු. එය ඉතා බරපතළ අවශ්‍යතාවකි.

කලක් යුද වැදී සිටි සමයේ මේ දේශය තුළම අපට අනුශාසනා කළ ශුද්ධ වූ දෙවන ජුවාම් පාවුලු එවකට සිටි විශ්ව සසුන් එඬේරාණන්ගේ වචන සිහියට නගා ගනිමු. අපගේ ආගම් හි ගැබ් වී ඇති විශාල ධර්ම ගුණ සම්භාර දේශයේ උන්නතිය සඳහාම අප උපයෝගී කරගත යුතු බවයි. උන්වහන්සේ සඳහන් කරනු ලැබුවේ මෙය එක් කණ්ඩායමකට පමණක් කළ නොහැකි හෙයින් විවිධ වූ ආගමික නායකයන් ලෙස අපද අත්වැල් බැඳගත යුතු බවත් පැහැදිලිය. ඒ කාර්යය සපුරාලන්නට ඒ සඳහා විශේෂ වගකීමක් ඇති ආගමික නායකත්වය ද සමඟ ඔබතුමන් බලවත් උපකාරයක්ම වේවා යැයි ප්‍රාර්ථනා කරමු.

රදගුරු පදවියේ විශේෂ වූ පූජක, පැවිදි පුද්ගල හා අනිකුත් විවිධ සම්පත්වලින් ගහන වූ පරිසරයක රදගුරු වසමේ ධීවර කර්මාන්තයේ නියැලී සිටින්නන් ද, විදේශීය රැකියාවල නියැලී සිටින්නන් ද, ඒවායින් පැන නැගෙන විවිධාකාර අභියෝගද සමගින් ඔබගේ සේවාව දියත් වීමයි දේව සැලැස්ම වී ඇත්තේ ඔබට භාර වන දේව ජනතාව අරබයා සමිඳුන්ගේ අභිමතය කෙසේ විය යුතු ද යන්න අවබෝධ කර ගන්නට ඔබට සපයා ඇති, මා ඉහත සඳහන් කළ පරිදි, පුද්ගල හා විවිධ සම්පත් ප්‍රයෝජනයට ගනිමින් හා හලාවත රදගුරු පදවියත්, ශ්‍රී ලංකා දේශයත්, ඒ තුළ විශේෂ සම්පත්වලින් ගහන නොවන දේව ජන කොටස් වෙනුවෙන් ද, ඔබගේ සම්පත් ප්‍රයෝජනයට ගන්නට සමිඳාණෝ ඔබ මෙහෙයවන සේක්වා! ඔබ කැඳවන දෙවි සමිඳුන්ගේ විශ්වාසවන්තකම සහ ප්‍රේමය තුළ ඔබට කුමන අන්දමේ "ගල් භාජන" පිළියෙල කරනවාද, ඒවා කෙසේ පුරවන්නට ආරාධනා කරනවාද යන්න, ජේසුගේ දිව්‍ය හෘදයට කැපකර ඇති රදගුරු වසමක ජේසුගේ උතුරා යන ප්‍රේමය තුළ, කාර්මෙල් මාතාවන් හා සන්තානම් මෑණියන්ගේ බලවත් මධ්‍යස්ථ පිහිට ඔබට ලැබේවා. ශ්‍රී ලංකා රදගුරු සමුළුව සමඟ සලාපුර සාගරයේ සිට දිලෙන පහනක් පමණක් නොව දේශීය සභාවේ අභිවෘද්ධිය සඳහාම දිලෙන ප්‍රදීපාගාරයක්ම (Light House) වන්නට ඔබට දේවාශීර්වාදය ලැබේවා. සන්තානම් මෑණියන්ගේ පිහිට සමඟ ජේසුස් සමිඳාණෝ ඔබතුමන්ට බලවත් ලෙසම ආශීර්වාද කරන සේක්වා.

**අති උතුම් නෝබට් ඇම්. අන්ද්‍රාදි**
**නි.ම.නි. රදගුරු හිමිපාණෝ**
අනුරාධපුර (උ.මැ.ප.) රදගුරු හිමි,
අනුරාධපුර රදගුරු පදවිය.

## සුහද ආරාධනා..... වසර 125 ජුබිලි සැමරුම .....

දයාබර භක්ති ප්‍රබෝධන ලේඛක, ලේඛිකාවනි, බෙදා හැරීමට දායකවන සැදැහැවතුනි, මේ සඟරාව ගැන උනන්දුවක් දක්වන දයාබර පාඨකයනි,

වසර 125 ක ගමන් මඟ සටහන් කරන දෙවියන් වහන්සේට තුති පුදන භක්ති ප්‍රබෝධනයේ 125 වැනි ජුබිලි සංවත්සරික, දෙවිඳුන්ට තුති පිදීමේ දිව්‍ය පූජාව **2024 සැප්. 17** අඟහරුවාදා (පෝය දින) **උදෑසන 9.00** ට මරදාන, පාතිමා දෙව්මැදුරේ ජයශ්‍රීයෙන් පැවැත්වේ. එමෙන්ම භක්ති ප්‍රබෝධන ජුබිලි තරඟාවලියට සහභාගි වූ ජයග්‍රාහකයන්ට ත්‍යාග ප්‍රදානය කිරීම, භක්ති ප්‍රබෝධන සඟරාව වෙනුවෙන් ඇප කැප වූ ලේඛක ලේඛිකාවන්ට මෙන්ම සඟරාවේ අභිවෘධියට කැපවූ අයට සිහිවටන ප්‍රදානය කිරීම සහ සමරු කලාපය එළිදැක්වීම ද මෙදින දිව්‍ය පූජාව අවසානයේදී සිදුවේ. **(සැප්. 29 වන දින පැවැත්වීමට තීරණය කර තිබූ භක්ති ප්‍රබෝධනය සම්බන්ධ උත්සවය නොපැවැත්වේ.)**

ලිපිනය : සංස්කාරක පියතුමා, භක්ති ප්‍රබෝධනය, නො. 265, ඩීන්ස් පාර, කොළඹ 10.

# අපේ නායකයන් කොයිබටද ?

**කලාභූෂණ කැලිස්ටස් ජයමාන්න**

"අනේ කුඹින්නේ තොපටත් රජෙක් ඉන්නේ"

මේ ශ්‍රී ලංකාව පරාධීනව සිටි යුගයේ අපටත් වටිනා නායකයකු අවශ්‍ය බවට එදා බෞද්ධ භික්ෂූන් වහන්සේ නමක වූ කුංකුනාවේ හිමියන් විසින් කියන ලද කවියක් ලෙස ප්‍රචලිතය. මෙයින් ගම්‍ය වන්නේ නායකයකුගේ ඇති වැදගත් කමයි. කුරා කුඹින්ටත් නායකයන් ඇති රටක අපට අවශ්‍ය නායකයෝ සිටිත්ද ? සිටිති. කප්පරක් නායකයෝය. ආගමික නායකයෝය. දේශපාලන නායකයෝය. සේවා ස්ථානවල නායකයෝය. මෙලෙස සිටිනා නායකයන් ප්‍රමාණය අනුව අනුගාමිකයන්ට, පාලිතයන්ට අපමණ සෙත සැලසී තිබේද ? නායකයන්ගේ අවවාදානුශාසනා, තීරණ, උපදෙස් එමටය. අනුනට දෙසන බණ ඒ අයවත් පිළිපදිනවාද ? "නායකත්වය යනු සුවපහසුව සලසන්නාවූ කබායක් නොව වගකීම් පවරන්නාවූ සළුවක් බව" හියුබට් හම්ප්‍රි නම් වූ (1961) කළමනාකරණ විශේෂඥයා සඳහන් කරයි. නායකත්වය යනු කළමනාකරණය යන්නට පර්යාය පදයක් නොවේ. (කීත් ඩේවිස් - 1967 නම් වූ විචාරකයා සඳහන් කරන්නේ නායකත්වය කළමනාකරණයේ කොටසක් බවත් විග්‍රහ කරන ලද පරමාර්ථ ධෛර්යවත්ව ඉටු කිරීමට සෙසු අය පෙළඹවීවට ඇති හැකියාව ලෙසට නායකත්වය විග්‍රහ කළ හැකි බවත් ය. කණ්ඩායමක් එක් කොට තබා ඉලක්කය කරා පොළඹවන මිනිස් සාධකය ලෙස ඔහු නායකත්වය දකී.


අප සමග සිටින කවර නායකයකු ගැන වුවද සමස්තයක් වශයෙන් කටපුරා සතුටුදායක ලෙස කථා කිරීමේ හැකියාවක් අපට තිබේද ? නායකයා සැම විටම තම අනුගාමිකයාගේ අපේක්ෂා පිළිබඳව නිසි අවබෝධය ඇතිව සිටිය යුතුය. නායකත්ව චර්යා ගැන කතා කරන විට එය සැලසුම් හා ආරම්භක ව්‍යූහය වශයෙන් ප්‍රධාන දෙකොටසට බෙදා තිබේ. ඉහත කී පරිදි තම අනුගාමිකයා කෙරේ දක්වන සැලකිල්ල "සැලකුමයි". මෙහිදී ඔවුනට සවන්දීමට ඇති කැමැත්ත හා අන්‍යෝන්‍ය විශ්වාසය ඉතා වැදගත්ය. එහෙත් අද අපේ බොහෝ නායක කාරණාදීන් වෙත දක්නට නොමැත්තේද මේ ලක්ෂණයමය. ආරම්භක ව්‍යූහය නායක අනුගාමික සබඳතා පැවැත්විය යුතු ආකාරයයි. සමහර නායකයෝ බිය ගැන්වීම මගින් අනුගාමිකයන් පාලනය කරති. සමහරු ප්‍රතිලාභ දීම මගින් අනුගාමිකයන් දිනා ගැනීමට උත්සාහ දරති. මැතිවරණ ආසන්නයේ හාල් කිලෝ 20 බැගින් දීම නිදසුනකි. තවත් සමහරු තමන්ට ලැබී ඇති හෝ තමන් ආරෝපණය කරගෙන ඇති බලය මගින් අනුගාමිකයන් පාලනය කරන්නට උත්සාහ ගනිති. තවත් සමහර නායකයන් තමනට ලැබී ඇති විශේෂඥ බලය, ඥානය, කුසලතා හා දැනුම මගින් සියල්ලන්ගේ ගෞරවය හා එකඟතාව ලබා කටයුතු කරති. ජෝන් එෆ් කෙනඩි, පිදෙල් කස්ත්‍රෝ වැනි නායකයන්ට තම රටේ පමණක් නොව පිටරටවලද අනුගාමිකයන් ඇතිවීමට තරම් ආකාස්මික බලයක් තිබේ. අපේ බෝහො නායකයන් ඔබ දමන්නේ මින් කවර ගොඩටද? මෙහිදී අපට පාස්කු ප්‍රහාරය සිහිපත්වේ. එහිදී අපේ නායක කාදිනල් හිමිපාණන් සිය අනුගාමිකයන් පමණක් නොව සමස්ත රටේම ලොවේම ජනතාවගේ ගෞරවය ආදරය දිනා ගත්තේ සිදුවිය හැකිව තිබූ මහා ව්‍යසනයක් වළක්වා ගැනීමට සිය උපායශීලි නැණ නුවණ භාවිත කළ බැවිනි.

නායකයන් පිළිබඳව අපගේ කිතුනු ඉගැන්වීම කුමක්ද ? මාක් සුබ වදනේ 10:42 සිට මෙලෙස සඳහන්ය. "විජාතිකයන් අතර ආණ්ඩුකාරයන් වශයෙන් සම්මත වූවත් ඔවුන් කෙරේ ආධිපත්‍යය පවත්වන බවත් ඔවුන්ගේ ප්‍රධානයන් ඔවුන් කෙරේ බලය පාන බවත් ඔබ දන්නාහුය. එහෙත් ඔබ අතරේ එසේ නොවේ. ඔබ අතර ප්‍රධානයා වන්නට කැමති යමෙක් ඇද්ද ඔහු ඔබේ සේවකයා විය යුතුය. ඔබ අතර ස්වාමියා වන්නට කැමති යමෙක් ඇද්ද ඔහු සියල්ලන්ගේ දාසයා විය යුතුය. මනුෂ්‍ය පුත්‍රයාණන් වුවද වැඩියේ සේවය ලැබීමට නොව සේවය කිරීමටය. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන එකම පියාණන් වහන්සේය". ඔබ නායකයෝ යැයි කියවා නොගන්න. "ඔබේ නායකයා එක් කෙනෙක්මය. එනම් ක්‍රිස්තුන් වහන්සේය. ඔබ අතර ඉතා උතුම් තැනැත්තා ඔබේ සේවකයා වන්නේය. තමාම උසස් කර ගන්නා කවරකු වුවද පහත් කරනු ලබන්නේය. තමාම පහත් කරගන්නා කවරකු වුවද ඔහු උසස් කරනු ලබන්නේය". මේ මතෙව් සුබවදනයි 23: 9 සිට. එදා ජේසු සමිඳුන් තම නායකත්ව පිරුවට පසක ලා තම ශ්‍රාවකයන්ගේ පාද සේදීමට තරම් බැහැපත් වූ බව සිහිපත් කරන කල අද බොහෝ නායකයන් නායකත්ව කිරුළෙන් හිස

උදුම්වා ගෙන අනුගාමිකයාට කවරක් සිදු වුවද තම අභිමාර්ථ සාධනය උදෙසාම සිය නායකත්වය තුළින් ලැබෙන සකල වරප්‍රසාද භාවිත කරන අයුරු කැපී පෙනේ. එහෙත් පාවුලුතුමා කොලොස්සිවරුනට ලියූ හසුනේ (4:1) පවසන්නේ ස්වාමිවරුන් ස්වර්ගයෙහි ඔබටත් ස්වාමිවරයකු සිටින බව සිතට ගෙන ඔබේ දාසයාට යුතු ලෙස හා සාධාරණ ලෙස සලකන ලෙසටය. ද්විතීය සංග්‍රහයේ 24:14-15 සහෝදර ජනතාවට, විදේශිකයනට, දිළිඳු අසරණ කුලීකරුවනට පීඩා නොකිරීම, නියමිත පරිදි නියමිත කුලිය ගෙවීම අවධාරණය කර තිබේ. උපදේශකයා හෙවත් සිරාක් 10 ඡේදයේ සඳහන් කරන්නේ නැණැවත් පාලකයා තම සෙනග විනයෙන් හසුරුවන්නේය. නැණවත් මිනිසකුගේ පාලනය මනා ලෙස ක්‍රමවත් වන්නේය. පාලකයන් යම්සේද නිලධාරීනුත් එසේමය. ආණ්ඩුකාරයා යම්සේද පුරවැසියනුත් එසේය යනුවෙනි.

එබැවින් අන් කවර ගිහි පැවිදි නායකයකු වුවද නායකයකු සතුවිය යුතු කිතුනු ඉගැන්වීම් මෙන්ම ඒවා පාදක කොට ගත් කළමනාකරණ සිද්ධාන්තවලට අනුකූලව ගුණාංග අනුගමනය කිරීම ඉතා වටිනා බව කිව යුතුය. සැබෑ නායකයා හරිදේ හරියට කරයි. වරදට වැට බඳී. ප්‍රතිඵලදායක බව ගැන නිතර අවධානය යොමු කරයි. සැම දෙයක්ම ජනතාව වෙත, ඔවුන් සඳහා, ඔවුන් වෙනුවෙන් ඔවුන්ගේ ප්‍රගමනයම අරමුණු කොට ගෙන සිදු කරයි. ඔහු දුරදිග පෙනෙන නුවණකින් හා දැක්මකින් යුක්තය. ජනතාවට අවශ්‍ය වෙනස්වීම් සඳහා යොමු කරවයි. අවශ්‍ය තැන්වල තම අභිමතාර්ථ පසක ලා, ජනතාව වෙනුවෙන් වෙනස්වීමට සූදානම් වෙයි. හැමවිටම බුද්ධිමත්ව මිස හැඟීම්වලට වහල්ව ක්‍රියා නොකරයි. තමා කරන නිවැරදි දේ ගැන ආත්ම විශ්වාසයෙන් පසුවෙයි. අධිෂ්ඨානශීලිය. සමාජශීලිය. වගකීම් දැරීමට මිස ඒවා අනුන් කර මත තබා අත සෝදා ගනීමට තැත් නොකරයි. තම අනුගාමිකයන් නිතර අභිප්‍රේරණයට ලක් කරයි. අද අපට අවශ්‍ය, හිඟව ඇත්තේ එබඳු නායකයන් ය.

# පිළිගනිමු වැඳලා දෝතින් ....



නායකයෝ ගැන කතා කරනවිට අපහට පළමුව ජේසුව මතකෙට එනවා
ගෝලයන් දොළොස් දෙනකුට නායකයාවී සිටි බව එදා සිට අද කියවෙනවා
අපත් සමග ලෝකයේ වැඩි ජන කොටසක් අද ජේසුට ගරුබුහුමන් දක්වනවා
පිරිසිදු නායකත්වයක් තිබුණේ ජේසුට කොයි කාටත් පිළිගන්නට එය වෙනවා

ඕනෑම පවුලක ගෙදරක නායකත්වය තාත්තාට ඉබේම හිමි වෙනවා
අඹු දරුවන් ගෙදර නායකයට නතුවී ඔහු කියනා විදියට වැඩ වෙනවා
ගැටලු සහගත තැන්වලදී තම බිරිඳගෙනුත් ඔවදන් ගන්නට වෙනවා
එවිට තමයි පවුලේ නායකත්වය මහ ඉහළින් සැමදා වැජඹෙනවා

ආයතනයක නායකයා කැමති නැහැ දෙවෙනියගෙන් උපදෙස් ගන්න
නායකයා කියනා දේ හරියයි කීමට කැමතිව දෙවනිය ඕනෑයි ඉන්න
එම විදියට ගියොතින් නායකයට වෙන්නේ කෙටි කලකින් දැක ගන්න
ආයතනය වසා දමලා රටිනුත් පැනලා පිට රටකට වී සැඟවී ඉන්න

එදා ලෝකයේ මුතු ඇටයයි කිව් ලස්සණ සිරි බර සිරි අප ලංකාවේ
නායකයන් කළේ ඔවුනට සිතූ සිතූ දේවල් බොහෝ විට අවේලාවේ
ලෝකයම කියයි හොඳ මොළකරුවන් වැඩියෙන් සිටිනවා සිරි ලංකාවේ
ඒ මොළ තමයි ගොඩගන්නට බැරි මේ වැනි හදියක් ලංකාවට වූවේ

බොහෝ දැනුමක් මිනුමක් ඕනෑම තැනක නායකයකු ළඟ තිබුණෝතින්
සැම වැඩ කටයුතු හරියට කෙරෙනවා කාටත් දැකගත හැකිය ඉතින්
හොර බොරු වංචා දූෂණ භීෂණ නොකරන නායකයකු ලැබුණෝතින්
කොතැනත් දියුණුවට පත් කරන නායකයන් පිළිගනිමු අපි වැඳලා දෝතින්

**පී. ඩබ්ලිව් සුනිල් ප්‍රනාන්දු - වාද්දුව**

# මනා පෞරුෂයකින් හෙබි නායකයන් පාසලට අවශ්‍ය කර තිබේ!

මේ වසරේ ශිෂ්‍ය නායකයින් වීමට කැමති දරුවන් ඉල්ලුම් පත්‍රයක් පුරවා, අදාළ ගුරුතුමියට බාර දෙන්න". විදුහල්පති, දරුවන්ට නිවේදනය කරයි. "ශිෂ්‍ය නායකත්වයට සුදුසු යැයි, ඔබ යෝජනා කරන සිසු දරුවන්ගේ නම්, අදාළ ගුරුතුමියට යොමුකරන්න". විදුහල්පතිගෙන් පන්තිභාර ගුරුභවතුන්ට දැනුම් දීමක්!

විවිධ ජන කොටස්වලට, විවිධ කණ්ඩායම්වලට විශේෂ වූ නායක ධුර ඇත. දේශපාලන නායකත්වය, ආගමික සංසවල නායකත්වය මෙන්ම, සමිති සමාගම්, විවිධ ආයතන මෙන්ම, ගම් මට්ටමේ නායක නායිකාවෝද පත්කරගනු ලබති. මේ අතර පාසලක හෝ දහම් පාසලක ශිෂ්‍ය නායක නායිකාවන් පත්කිරීමද සිදුවේ. පාසලකට පොදු ශිෂ්‍ය නායක කණ්ඩායමක් මෙන්ම, පන්ති නායක නායිකාවෝ පත්කරනු ලබති. එලෙසම පාසලේ තූර්ය වාදක කණ්ඩායම, ක්‍රීඩා කණ්ඩායම්, ගායනා කණ්ඩායම වැනි කුඩා ඒකක සඳහා නායකත්වය දරන්නෝද සිටිති. මේ සියලු නායක ධුර අනාගත ආයෝජනයි. ඒ රටට, ගමට, පවුලට පමණක් නොව තමන්ටමය.

මා මෙලෙස සඳහන් කළේ, හෙට දවසේ, දේශයේ, ග්‍රාමයේ හෝ ආයතනයක, ආගමික සංසයක නායකත්වයට සුදුස්සෙක් බිහිවනුයේ, බොහෝ විට ඉහතකී ළමා නායකයන් අතුරින් ය.

"මගේ සෑම ක්‍රියාවක් පිළිබඳවම, පූර්ණ වගකීම ගැනීමට, මා පුරුදු පුහුණු විය යුතුය". මේ කියමනෙන් අදහස් වන්නේ, ස්වකීය පෞරුෂය ගොඩනගා ගැනීමට, ප්‍රධාන වගකිව යුත්තා තමන්ම බවය. නායකත්වය දැරීම තමාටම ආයෝජනයක් වන්නේ මේ නිසාය. කෙසේ වුවද, අනාගත නායකත්වය සඳහා දරුවන් යොමු කිරීම හා මග පෙන්වීම, පවුල, පාසල මෙන්ම, ආගමික ආයතන තුළින්ද කළ යුත්තකි. නිවස තුළදී හැඩගස්වනු ලබන ළමා චරිතය, පාසල පල්ලිය පන්සල වැනි, විධිමත් ආයතන හරහා කෙරෙන ක්‍රමවත් මග පෙන්වීම තුළින්, මනා ලෙස ඔප මට්ටම් වූ චරිතයක් බවට ගොඩනංවනු ලැබේ. ශිෂ්‍ය නායක ධුරය, මේ සඳහා ඉමහත් පිටිවහලකි. මෙලෙස වචනයෙන්, ක්‍රියාවෙන් මෙන්ම, ආකල්පවලින්ද යහපත් වූ පෞරුෂයක් ඇති චරිතයක අභිමානය ප්‍රදර්ශනය වන නිර්ණායක බොහෝය.

- තමා ක්‍රමානුකූල වීමට ප්‍රයත්න දරයි.
- නිසි පිළිවෙළට මෙන්ම, කලට වේලාවට වැඩ කරයි.
- අන් අයගේ උපදෙස්වලට සාවධානව සවන්දෙයි.
- අන්‍යයන්ගේ දොස් නොසොයා, තම සේවය උපරිමව ඉටුකොට තමා ගැන සතුටු වෙයි.
- ගෞරව කළ යුත්තන්ට, මුළු හදින්ම ගෞරව කරයි.
- ක්‍රියාශීලීව, කළ යුතු දේ අවසානය දක්වාම ඉටු කරයි.
- පරිස්සමින් වචන හසුරුවයි.
- තමාට හෝ පාසලට / ආයතනයට නැතහොත් පවුලට අපකීර්තියක් නොවන අයුරින් හැසිරෙයි.
- අභියෝගවලට ඉවසීමෙන්, අභීතව මුහුණ දෙයි.

කිතුනු විශ්වාසයට අනුව, මෙතෙක් ලොව පහළවූ ශ්‍රේෂ්ඨතම නායකයා වන්නේ ජේසුස් වහන්සේය. " ඔබ අතර ප්‍රධානියා වන්නට කැමති යමෙක් ඇත්ද, ඔහු සියල්ලන්ගේ දාසයා විය යුතුය" (මාක් 10:43-44). මෙය නායකත්වය පිළිබඳ හොඳම නිර්වචනයයි. සේවක නායකත්වය තම ක්‍රියාවෙන් පෙන්වූ ක්‍රිස්තුස් වහන්සේ තම ජීවිතයෙන් ඊට සාක්ෂි දැරූ සේක. ගෝලයන්ගේ පාද සේදීම, පේදුරුතුමාට මෙන්ම ජුදාස්ටත් සමාව දීම මෙයට නිදසුන්ය. කිතුනු අනුගාමිකයන් වන අපි සැම දේව සේවකයෝ වෙමු. ඒ සේවකයන්ගේත් සේවකයාන්වන්නේ ශුද්ධෝත්තම පාප්වහන්සේය. ඒ පදවියට පත්වූ උතුම් මනුෂ්‍යයන්ගෙන්, නායකත්වය පිළිබඳ අපට උගත හැකි පාඩම් බොහෝය. තම බැටළු රැළ වෙනුවෙන් කැපවීම, බැහැපත්කම, වගකීමට වගවීම, ජීවිතාදර්ශය මින් සමහරකි. ජේසුස් වහන්සේ පේදුරු තුමාට

නායකත්වය බාරදෙමින්, ශුද්ධවූ සභාවේ වගකීම පැවරූ සේක. ශුද්ධාත්මානුභාවයෙන් සන්නද්ධවූ පේදුරු තුමා, ඒ වගකීම අකුරටම ඉටුකළා පමණක් නොව, තම ස්වාමින්වහන්සේට ඇති ගෞරවය හා බැහැපත්කම, සිය මරණ මොහොතේදී පවා පෙන්නුම් කළේය.

නායකත්වය යනු මිනිසුන් පාගා, තමා වැජඹීම නොව, අන්අයගේ යහපත උදෙසා තමා වැයවීමය. වර්තමානයේ ඕනෑම සමාජ ස්තරයක් සැලකූ විට, නායකයන්ගෙන් බහුතරයක් පරමාදර්ශී චරිත නොවේ. මිනිසුන් පීඩාවට පත්කරමින්, බලය තනතුර ඔටුන්නක් කරගත්, පිල් විදහා රඟන මොනරුන් බවට අද නායකයින් පත්ව ඇති බව නොරහසකි. සිය නායකත්වය ලබන්නන් නංවා තැබීම නොව, තමාම උසස්වීමේ පරමාර්ථයෙන් තම ධූරය අවියක් කරගන්නා නායකයා, සැබෑ සේවකයකු නොවන බව අවිවාදයෙන් පිළිගත යුත්තකි.

පැරණි ගිවිසුම දෙසට අවධානය යොමුකළහොත්, නායකත්වයේ වගකීම දිවි හිමියෙන් ඉටුකළ, ආබ්‍රහම්, මෝසස්, ජෝෂුවා, සාමුවෙල්, දෙබෝරා වැනි චරිත අපට හමුවේ. ඔවුහු ජනතාවගේ ජීවිතයේ විවිධ අභියෝග අවස්ථාවල, ධාර්මික ඉගැන්වීම් මගින් ඔවුන් දිරිමත් කළහ. මග පෙන්වූහ. ඒ ඒ වකවානුවල දෙවියන්වහන්සේ විසින්ම කැඳවනු ලැබූ දිවැසිවරුද, ජනතාවට විශිෂ්ට නායකත්වයක් දෙමින්, ඔවුන් යහමග යවන්නට ප්‍රයත්න දැරූහ. එමෙන්ම නව ගිවිසුමේ අපෝස්තුලුවරුද, ජේසුස් වහන්සේ තමන්ට පැවරූ නායකත්ව කැඳවීමට අවංකව සාක්ෂි දැරූහ. උපරිමය ඉටුකළහ.

එසේ නම් පාසලක නායකත්වයක් දරන සිසුවකුට පැවරී ඇති කාර්යභාරය කුමක්ද ? දුවේ, පුතේ ඔබ සමාජයට වැදගත් කෙනෙකි. ප්‍රධාන කොට, පෙර කී ලෙස අභිමානවත් චරිතයක් බවට පත්වීමට උත්සුක වන්න. නායකත්වයෙන් හිස උදුමා නොගෙන, හැම කෙනකුටම සහෝදරත්වයෙන්, ගෞරවයෙන් සලකන්න. නායකත්වයේ වගකීම් කැපවීමෙන් හා සතුටින් ඉටු කරන්න. ජීවිත ආදර්ශයෙන් අනික් සිසු සොහොයුරු කැලට මග පෙන්වන්න. නිතර හරි දේ කරන්න. අන් අයගේ වැරදි බස්වලට නොරැවටී, සමාජයට මෙහෙවරක් කළ හැකි, අලුත් දෙයක් ගැන සිතන්න. දැනුම් වර්ධනය කරගැනීමට උත්සාහ දරන්න. ආත්ම ගරුත්වය දිවි නොදෙවැනි කොට සිතන්න. කළ යුතු දේ, කළ හැකි දේ ගැන බුද්ධිමත්ව සිතා කටයුතු කරන්න.

මගේ ගුරු ජීවිතයේ අත්දැකීම් අනුව, පාසල් දිවියේදී විවිධ නායකත්ව දැරූ දරුවන්, නායකත්ව කුසලතා ඇති පුරවැසියන් ලෙස සමාජයේ ඉදිරියට එන අවස්ථා සුලබය. සමාජයේ පිළිගත හැකි තත්ත්වය හෝ යහපත් කැපී පෙනෙන චරිතයක් ඇති ආදි සිසු සිසුවියන් හමුවූ විට, ඔවුන් ශිෂ්‍ය නායකයන් ලෙස කටයුතු කළ අයුරු සිහිපත්වේ. තම වගකීම් ඉටුකරමින්, සෙසු ශිෂ්‍ය ශිෂ්‍යාවන්ට කරුණාව හා ආදරය පෙරදැරිව උපදෙස් දෙමින් මග පෙන්වීම මෙන්ම, විදුහල්පති ඇතුළු ගුරු මණ්ඩලයට ගෞරවයෙන් අවනත වීම, ඔවුන්ගේ ඉදිරි ජීවිතයේ සාර්ථකත්වයට රුකුල් වූවා නිසැකය. ශිෂ්‍ය නායකයා යනු රජකු වැනි, සාම්ප්‍රදායික නායකයෙක් නොවේ. පාසලේ හෝ දහම් පාසලේ විනය පද්ධතියට අනුගතවන, යම් මට්ටමක අධිකාරී බලයක් ඔහුට ලැබී ඇත. එහෙත්, ආචාර්ය මණ්ඩලයට අවනත හා අනිකුත් සහෝදර සිසුන්ට සේවකයකු විය යුතු බව සිත් තබා ගන්න.

ආදර දරුවනි, සේවක නායකත්වය සඳහා, සැමවිටම බුද්ධියෙන් තීරණ ගන්න. සාරධර්ම අගය කරන්න. ආකල්ප යහපත් වන තරමට ඔබට හොඳ නායකයකු විය හැකිය. නිර්මාණශීලී උපක්‍රම මගින් පාසලේ ආචාරධර්ම හා විනය පවත්වා ගැනීමට, ගුරු මව්පියවරුනට සහාය වීම ශිෂ්‍ය නායකයාගේ වගකීමයි. පරමාදර්ශී චරිතයක් ලෙස ජේසු දෙසට හැරෙන්න. විවිධ චරිත ඇති, විවිධ රැකියාවල හා සමාජ මට්ටම්වල සිටි ගෝලයන්ව, එකම අරමුණක් කරා ගෙන යාමට, උන්වහන්සේගේ නායකත්වය සමත් විය. ඔබට පාසලේ නයකත්වයක් ලැබේ නම්, එය නොපසුබටව බාරගන්න. චෝදනා හා ප්‍රශංසා යන ගල් හා මල් දයාබරව පිළිගන්න. ඔබට ඉවසීම හා සංවිධාන ශක්තිය ලැබෙනු ඇත. ඔබේ අනාගත ජීවිතයට, ශිෂ්‍ය නායකත්වය මහගු පිටිවහලක් වනු ඇත. පෞරුෂය ගොඩනගා ගැනීමට, කුසලතා වර්ධනයට මෙන්ම, සම්මුඛ පරීක්ෂණයකට මුහුණ දීමට ද බෙහෙවින් ඉවහල් වේ.

සිසු දූ දරුවනි, නායකත්වය තුළින් හුදෙක් උගතකුට වඩා බුද්ධිමත් මෙන්ම ප්‍රඥාවන්තවී, සමාජයට ඵලදායී මෙහෙවරක් කළහැකි උතුම් මිනිසකු වීමට වෙර දරන්න.

**බී. රූබි රුද්‍රිගු - හපුගොඩ**

# ෨෦෨෫ ජුබිලි වසර්ට බැතිබර්ව පා තබමු.

(2022 පෙබරවාරි 11 වනදා ලූර්දු දර්ශනයේ මංගල්‍යය දින අති උතුම් ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පාප් වහන්සේ රෝමයේ සා. ජෝන් ලැටරන් දේවස්ථානයේ සිට ජුබිලි වසර ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් කරන ලද අනුශාසනාව ඇසුරෙනි.)

“ස්වර්ගයෙහි ද පොළොවෙහි ද සියලු බලය මට පවරා තිබේ. එබැවින් ඔබ ගොස් සකල ජාතීන් ගෝලයන් කරන්න... මම ද යුගාන්තය දක්වා ඔබ හා සමඟ සිටිමි.” (මතෙව් 28:19-20) යන කිතු සමිඳුන් මුවින් නික්මුණු වදන් සභාවේ ධර්මදූත කාර්යයට ආරාධනයකි. සාන්ත සභාව වනාහි ක්‍රිස්තුන් වහන්සේ වදාළ ධර්මයෙහි පිහිටා සකල ජාතීන් වෙත උන්වහන්සේගේ ගැලවීම්දායක සුබාරංචිය ගෙන යන ව්‍යුහමය දහමකි. එහි පදනම ක්‍රිස්තුන් වහන්සේය. ශු. පාවුලු තුමන් පවසන ආකාරයට උන්වහන්සේ අතීන්ද්‍රිය ක්‍රිස්තු දේහය වන සභාවේ හිස වන අතර විශ්ව සභාවේ සැම සාමාජිකයෙක්ම එකී හිසෙහි එකී ශුද්ධාත්මික ක්‍රිස්තු දේහයේ අවයවයි.

ජුබිලි වසරක් හෙවත් ශුද්ධාසනය ශුද්ධවූ වසරක් ප්‍රකාශ කිරීම සියවස් හතක අතීතයට දිව යන සිද්ධියකි. අටවන බොනිපස් පාප්තුමන් ක්‍රි. ව. 1300 දී පළමු ශුද්ධවූ වසර ප්‍රකාශයට පත් කළ අතර ඉන් පසුව වසර 100කට වතාවක් මෙවැනි ශුද්ධවූ වසරවල් සිදු කරන ලදී. පසුව සැම වසර 50කටම වතාවක් ද ඉන්පසුව සෑම වසර 25කට වතාවක් ද ශු. බයිබලය ප්‍රකාරව ජුබිලි වර්ෂයන් ප්‍රකාශයට පත්කිරීම ශුද්ධාසනය විසින් සිදු කරන ලද්දේ දෙවියන් වහන්සේගෙන් විශේෂ වූ වරප්‍රසාද සහ පව් සමාව ජනතාව වෙත දානය කිරීමටත් පූර්ණ ඵල දීම හේතුවෙන් ඔවුන්ව නැවත දේව සම්බන්ධතාවෙහි පිහිටුවීම සඳහාත් ය. අපට මතක මෑත ඉතිහාසයේ ක්‍රි.ව. 2000 වර්ෂය විශේෂ සහස්‍රකයක් අපි පසු කළ අවස්ථාවකි. එවකට දෙවන ජුවාම් පාවුලු වර්තමාන සාන්තුවර ශුද්ධෝත්තම පාප්වහන්සේ මෙම ජුබිලි වසර ප්‍රකාශ කළේ විශේෂයෙන් පව් සමාව නව සහස්‍රකයට කිතුනු සභාව දෙවියන් වහන්සේට සමීප කරලීමේ අරමුණෙනි. ඒ සඳහා සූදානමක් ලෙස දේව දයාවේ සුවිශේෂ වූ වසරක් ප්‍රකාශයට පත්කරමින් සභාව දෙවියන් වහන්සේගේ දයාන්විත ආදරයට නතු කරමින් සහා නවෝදයකට මුල පිරීම ශුද්ධාසනයේ අරමුණ විය. මේ 2025 වසර ජුබිලි වසරක් ලෙස ප්‍රකාශ කිරීමට ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පියතුමාට හේතු වූ කාරණ කිහිපයක් උන්වහන්සේගේ ජුබිලි වසර ප්‍රකාශ කිරීමේ ශුද්ධාසන ලිපියේ පැහැදිලිව සටහන් කර ඇත. එයින් විශේෂ කාරණයක් වන්නේ පසුගිය වසර දෙක පුරා කොවිඩ් වසංගතයෙන් බැට නොකෑ රටක් නැති නිසාය. උන්වහන්සේ පවසන ආකාරයට ඒ ව්‍යසනය ජනතාව තුළ දේව ධාර්මික වශයෙන් සැකයක් අවිනිශ්චිත භාවයක් බියක් දෙවිඳුන්ගෙන් ඈත්වීමක් ඇති කළ නමුත් එදිනෙදා කටයුතු නැවත යථා තත්ත්වයට පත් වීමේ දී මේ වසංගතය දෙවිඳුන්ට අපි කිට්ටු කළ අත්දැකීමක් ලෙස දැකිය හැකි බව උන්වහන්සේ අනුශාසනා කරන සේක.

ශුද්ධෝත්තම ෆ්‍රැන්සිස් පියතුමා පවසන ආකාරයට ජුබිලි වසරක ආධ්‍යාත්මික දෘෂ්ටිකෝණය වනාහි මනස්තාපයයි. එනම් දෙවියන් වහන්සේ වෙතට හැරී ඒමයි. උත්පත්ති පොතේ දෙවන පරිච්ඡේදයේ පහළොස්වන වගන්තිය “ඒදන් උයන වගා කර එහි රැක බලාගැනීම පිණිස දෙවි සමිඳාණන් වහන්සේ මිනිසා රැගෙන ඔහු එහි පදිංචි කරවූ සේක.” යන වදන මතක් කරන්නේ මුළු මැවිල්ල කෙරෙහි වන මනුෂ්‍යයාගේ වගකීමයි. එය අපි සියලු දෙනාගේ පොදු නිවාසය වන මේ මිහි මත සහ විශ්වය රැකබලා ගැනීම පිළිබඳව වන දේව ආරාධනයයි. ශුද්ධෝත්තම පාප් වහන්සේගේ අවධානය යොමුවන්නේ එළඹෙන

ජුබිලි වර්ෂය සිදුකිරීම කළ යුතු වන්නේ මේ විශ්වීය රැක බලා ගැනීම කෙරෙහි දැඩි අවධානය යොමුකරවීමෙනි. විශ්වය මැවිල්ල යනු අපගේ අත්‍යවශ්‍යම විශ්වාසය ප්‍රකාශ කිරීමක් සහ විශ්වාසයට සාක්ෂි දැරීමක් බව තරුණ තරුණියන් මෙන්ම ළමා පරපුර ද අවබෝධ කරගැනීම උන්වහන්සේගේ අභිප්‍රායයි. එනයින් බලන කල ජුබිලි වර්ෂයක අත්‍යවශ්‍යම කාරණය මනස්තාපයට කැඳවීමයි. ද්‍රව්‍යමය වූ ලෞකිකත්වයට දැඩි නැඹුරුවක් ඇති ආගමික හර පද්ධති බැහැර කොට තමන්ගේ නීති සම්පාදනයේදී ස්වාභාවික නීතිය පමණක් හෝ හෘදය සාක්ෂිය මත පදනම් නොවූ වෙනයම් සංකීර්ණ හර පද්ධති යැයි කියා ගන්නා අරුත් සුන් සමාජ රටා මඟින් ගබ්සාව නීති ගත කිරීම, සමලිංගික විවාහ අනුමත කිරීම, ස්වාභාවික නීතියටත් ආගමික නීතියටත් පටහැනි වූ සමාජ සම්බන්ධතා ප්‍රවර්ධනය කිරීම සහ පවත්වා ගෙන යාම එළිපිටම මනුෂ්‍යත්වය ගබ්සා කිරීමකි. මෙවැනි සංකූල හා සංකීර්ණ සමාජ වපසරියක ධර්මදානයේ යෙදෙන සාන්ත සභාව ලෝකයේ ආලෝකය ලෙස පවතින්නට නම්, වැරැද්ද සාධාරණීකරණය නොකොට නමුත් වැරදිකරුවන් යයි සමාජය හංවඩු ගසනා පව්කාරයන්ව මනස්තාපයට කැඳවිය යුතුමය. යහපත් එඬේරාගේ ක්‍රියාව නොමඟ ගිය බැටළුවන් රැළට ගෙන ඒමයි. ජුබිලි වර්ෂයක් අපට ආරාධනය කරන්නේ මේ පව්කරුවන්ගේ සිත් හැරීම පිණිසත් ඔවුන්ගේ හෘදය සාක්ෂිය අවදි කරවා දෙවියන් වහන්සේ වෙතට යොමු කිරීමටත් ඔවුන් පෙලඹවීමටයි.

ජුබිලි වර්ෂයක අනිකුත් අත්‍යවශ්‍යම සාධකය යාච්ඤාව ප්‍රගුණ කිරීමයි. යාච්ඤාව වනාහි ක්‍රිස්තියානි ජීවිතයේ පදනමයි. දෙවියන් වහන්සේට අප ඔසවන ඉණිමඟයි. යාච්ඤාව තුළ සැම අරගලයක් ම, ප්‍රශ්නයක් ම, පීඩාවක් ම, ජය ගත හැකි බව ශුද්ධ ලියවිල්ල පැහැදිලිව අපට පෙන්වා දෙයි. ශුද්ධෝත්තම පියතුමා අනුශාසනා කරන්නේ යාච්ඤාව වනාහි දෙවියන් වහන්සේට ප්‍රශංසා කිරීමක් බවයි. එය අප ලැබුවාවූ බහුවිධ ත්‍යාගවලට, වරප්‍රසාදවලට උන්වහන්සේට කරන තුති පිදීමක් මෙන්ම මුළු මැවිල්ල සමඟ ම උන්වහන්සේට කරන එක්තරා ආකාරයක නමස්කාරයකි. හදවතෙහි සහ ආත්මයෙහි පිළිබිඹුවක් වන යාච්ඤාව (ක්‍රියා 4:32) අපගේ එදිනෙදා භෝජනය මෙන් දේව හස්තය මත යැපීමේ ගුණාංගයක් පිළිබිඹු කරයි. යාච්ඤාව මෙලොව වසන සැම මිනිසකුටම ස්ත්‍රියකටම දෙවියන් වහන්සේ වෙතට හැරී උන්වහන්සේගේ අනාවරණයන් අවබෝධ කරගෙන අප පිළිබඳ වන උන්වහන්සේගේ සැලැස්ම (ජෙරමියා 29:11) අවබෝධ කර ගැනීමට ශුද්ධාත්මයාණන් වහන්සේ තුළ කෙරෙන මඟපෙන්වීමකි. ශුද්ධෝත්තම ප්‍රැන්සිස් පාප් වහන්සේගේ වදන්වලට අනුව යාච්ඤාව වනාහි ශුද්ධවන්තකමට ඇති "රාජකීය මාවත-යි". එය සාමාන්‍ය මාවතක් නොවන්නේ යාච්ඤාව තුළ අපි ධ්‍යාන ගතව මෙනෙහි කරන ජීවිත යථාර්ථය අපව දෙවිඳුන්ගේ "හදවතටම ඇතුළු කරන නිසාය ". එය සමිඳුන් වෙත නගන නිරන්තර දුම් පූජාවක් සේ අපේ යාච්ඤා ස්වර්ගයේ වැඩ සිටින යාච්ඤාව තුළ ස්වාමින් වහන්සේට ඔසවද්දි උන්වහන්සේගේ අලෝකය සහ වරප්‍රසාද අප ජීවිතවලට ගලා විත් ඒවායින් අප ආලෝකවත් කරයි.

හෙබ්‍රව් භාෂාවෙන් හසාසිය යනු සති ගණනක සත් වර්ෂ පූරණයකට පසුව එන වසරයි. එසේත් නැතිනම්, සබත් වර්ෂ හත හතෙන් ගුණ කළ විට එනම් වසර 49 කට පසුව එන වර්ෂයයි. මේ පිළිබඳ පැහැදිලි ඉගැන්වීමක් පංච පුස්තකයේ ඇත. එනම් ලෙවී ව්‍යාවස්ථා ග්‍රන්ථයේ විසිපස්වන පරිච්ඡේදයේ අටවන වගන්තියේ සිට සඳහන් වන්නේ මෙයයි. " අවුරුදු හතෙන් හතට පැමිණෙන සබත් වර්ෂ හතක් වැඩි කළ විට අවුරුදු 49ක් ලැබෙනු ඇත. එවිට හත්වන මාසයේ දහවන දින එනම් පව් කමා කිරීමේ පිළිවෙත ඉටු කරන දින මුළු රට පුරා හොරණෑව රැව් පිළි රැව් දීමට සැලැස්විය යුතුය... ". සබත් වර්ෂයකදී කළ යුතු සහ නොකළ යුතු දේ ලෙවී ව්‍යාවස්ථාවේ ද,

පංච පුස්තකයේ ද, පැහැදිලිව සඳහන් ව ඇත. දෙවියන් වහන්සේ සියලු දේ මවා දින හයකදී වැඩ නිමවා හත්වන දින නිවාඩු ගෙන එය සබත් දින ශුද්ධ දවසක් බවට පත් කළ සේක. ඊශ්‍රායෙල් කෘෂිකර්ම ඉතිහාසය අවුරුදු හතක් නොකඩව කන්න වගා කොට හයවන වසරේ දී, අස්වැන්න දෙගුණයකින් උපදවන අයුරින් වගාකොට හත් වන වර්ෂය පොළොවට හා පසට නිවාඩු දී තිබුණි. එයින් අදහස් කළේ වගා කරගන්නා මැවිල්ලට පවා නිදහසක් නිවාඩුවක් දිය යුතු බවය. එවැනි වර්ෂ හත හත් ගුණයකින් වැඩි කළ පසු, එනම් වර්ෂ හතළිස් නමයකට පසුව එන වර්ෂය ඔවුනට සුවිශේෂී ජුබිලි වර්ෂයක් වේ. ඒ ජුබිලි වර්ෂයේදී, ණයකරුවන්ගේ ණය ණයහිමියන් කමා කිරීමද, ණය ගෙවීමට නොහැකි වූවන්ට ඒ ණය කපා හැර ඔවුන් නිදහස් කිරීම ද වහලුන් නිදහස් කිරීමට සමාන වෙයි. ඒ වර්ෂයේදී, තරහකරුවන් හෝ එදිරිවාදීන් සමග ඇති අමනාපකම් නැතිකොට සංහිඳියාව සාමය ප්‍රගුණ කිරීමද, පවුල් අතර ආරවුල් විසඳා ගැනීම ද, දුගී, මගී, යාචකයන්ට දන් දීම ද, අඩුපාඩු අගහිඟකම් ඇති අයගේ අවශ්‍යතා පිරිමසා ගැනීම ද, කළ සත්කාර යි. ඒවා ලෙවී ව්‍යාවස්ථාවේ ද, පංච පුස්තකයේද, අත්‍යවශ්‍ය අංග ලෙස සඳහන්ය.

ජුබිලි වසරක ශුද්ධ ලියවිල්ල සහ ශාන්ත සභා පසුබිම කවරක් වුවත්, ශ්‍රී ලාංකික කතෝලික සභාවේ දේවස්ථාන ජුබිලිවල අප දකින පොදු ලක්ෂණයක් ඇත. එනම් ජුබිලිය යයි කියා බහුතරයක් දේවස්ථානවල අපි පවත්වන්නේ අප දකින වර්තමාන දේවස්ථාන ගොඩනැගිල්ලේ වයස සහ පෞරාණිකත්වය හා සම්බන්ධ සිහිකිරීමකි. ජුබිලියකදී කරන කටයුතු දේවස්ථානය නවීකරණය කිරීම, මීසමේ සමිති සමාගම් ප්‍රතිස්ථාපනය කිරීම, දේවස්ථානයට අලුතින් ගොඩනැගිලි ඉදිකිරීම, වැනි ව්‍යාපෘති සඳහා මීසම්වල පියතුමන්ගෙත් මීසම් සභාවන්ගේත් අවධානය යොමුකිරීම, එක්තරා අතකින් කනගාටුවට කරුණකි. ජුබිලියකදී සිදුවිය යුත්තේ ශු. බයිබලයට අනුව ණයකරුවන්ගේ ණය ගෙවා ගැනීමට උදවු කිරීමයි. ණය වාරික ගෙවා ගන්නට බැරි අයට සහාය වීමයි. ණය දෙන රැකියාව සාධාරණ ලෙස සිදු කිරීමට ඔවුන්ගේ හෘදය සාක්ෂි අවදි කිරීම, අසමඟියෙන් සිටින පවුල් සමාදාන කිරීම, වෙන් වූ අඹුසැමියන් නැවත එකතු කිරීමට පවුල් අපෝස්තලික සේවා දිරිගැන්වීම නිවාස නැති අයට නිවාස දීම, සනීපාරක්ෂක පහසුකම් නැති ඉතා දිළිඳු මට්ටමේ ජීවත් වන පවුල් නගා සිටුවීමට කටයුතු කිරීම නිසි අධ්‍යාපනයක් නොමැතිව නොමඟ යන තරුණ තරුණියන් දූ දරුවන් සොයා ගොස් ඔවුන්ගේ අවශ්‍යතා පිරිමැසීමට උත්සුක වීම, ගිහි නායක නායිකාවන්ගේත් මීසම් භාර පියවරුන්ගේ සහ කන්‍යා සොහොයුරියන්ගේත්, මූලිකම වගකීම වන්නේ සැබෑ එඩේරික සභාවක් සංගමනශීලී හෝ සහභාගිශීලී සභාවක් ගොඩනැගිය හැකිවන්නේ ජනතා අවශ්‍යතාවලට සංවේදී වපසරියක් නිර්මාණය කිරීමෙන් පමණකි. ඒ විනා දේවස්ථානයක් කෙතරම් බාහිර අංග උපාංගයන්ගෙන් නවීකරණ කරන ලද නවීන විදුලි උපාංගවලින් සහ අලංකාර උද්‍යානවලින් ලස්සණ කළ ද, එහි ඇතුළත සැබවින්ම ලස්සණ වන්නේ අලංකාර වන්නේ මීසම් වාසීන්ගේ ජීවිත මඟිනි. මීසම් වාසින්ගේ ජීවිත ඝන අඳුරේ තිබේ නම් ඔවුන්ගේ දරුවන් නොමඟ ගොස් සිටී නම් ඔවුන්ගේ දේව විශ්වාසය හීන වී නම් දේවස්ථානය ගොඩනැගිල්ලක් කෙතරම් බාහිර ඔප දැම්මද එහි ඇති ආධ්‍යාත්මික පලක් නැත. මේ අනුව බලන කල ජුබිලි වසරක් ශුද්ධෝත්තම පියතුමා ප්‍රකාශ කිරීම සැබවින්ම වැදගත් ය. ජුබිලි වසරක් උච්චාරණය කරන දේව වන්දනා පොදු යාච්ඤාවට හෝ ගීතිකාවට හෝ දේවස්ථානය ප්‍රදර්ශනය කරන ජුබිලි වසරේ බැනරයට හෝ රදගුරු වසම් සංවිධානය කරන ආධ්‍යාත්මික ගමන් පූර්ණ ඵල ගැනීමේ ඒ ශුද්ධවූ දොරටු වලින් ගමන් කිරීම සහ අනිකුත් බාහිර වත්පිළිවෙත්- වලට පමණක් සීමා වෙයි නම් එයින් ජනතාවගේ සැබෑ සිත් වෙනසක් ඇති නොවේ නම්, ඒ ජුබිලි වසර අර්ථාන්විත වසරක් වන්නේ ද? **එනිසා සාන්ත සභාවේ අප සියලු දෙනා අවධානය යොමු කළ යුත්තේ අපගේ බාහිර වත්පිළිවෙත් සහ අලංකරණ හුදු අටෝපයට වඩා ඇතුළත සිත් හැරීමකට අපගේ ජනතාව යොමු කිරීමයි**. මරුද මඩු සිද්ධස්ථානය, වහකෝට්ටේ සාන්ත අන්තෝනි සිද්ධස්ථානය, තලවිල සාන්ත ආනා සිද්ධස්ථානය, කොච්චිකඩේ

සාන්ත අන්තෝනි සිද්ධස්ථානය වැනි සුපතළ සිද්ධස්ථාන වෙත යොමු කරනුයේ විශේෂයෙන් රදගුරු වසම්වල ජුබිලි වසර සඳහා විවෘත කර ඇති ද්වාරයෙන් පාපෝච්චාරණය කොට ඇතුළු වීමට පෙලඹවීමයි. එයින් ලැබෙන පූර්ණ ඵල තුළ වරප්‍රසාදීය ජීවිතයකට ඇතුළු වීමටත් විශේෂයෙන් මරණීය පව් තුළ සිර වී සිටිනා ආත්ම මුදවාගෙන ඒ අය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ මඟින් දිව්‍ය සත්ප්‍රසාද භක්තිය ප්‍රතිස්ථාපනය කිරීම මඟින් ඒ අය ශුද්ධවන්ත කිරීමට පෙලඹවීම ජුබිලි වසරක අරමුණයි. ශුද්ධෝත්තම පියාණන්ගේ එකී අරමුණට අපි ඒකාබද්ධ වන්නට නම් ඉහත කී කාරණ පිළිබඳ අවංක ප්‍රතිපෝෂණයක් කළ යුතුමය. සභාවේ උන්නතිය සඳහා ක්‍රි.ව. 1995 ශ්‍රී ලංකා කතෝලික සභාව ධර්ම දානයේ සමුළුවක් (pastoral convention) කැඳවූහ. එහි නිර්දේශ වසර 25 කට පසුවත් අප කෙතරම් දුරට ක්‍රියාත්මක කර ඇත්දැයි විමසා බැලීම වටී. මෙය එක රදගුරු වසමකට සීමාවන යථාර්ථයක් නොව මූල ධර්මවාදය, දරිද්‍රතාව, අන්‍යාගමික බලපෑම්, මිශ්‍ර විවාහ, කතෝලික අධ්‍යාපනය සම්බන්ධයෙන් ඇති අභියෝග, ඇතුළු විවිධ විෂමාචාරී සමාජ දේශපාලනික ආර්ථික සහ විශ්වාසයට බලපාන කරුණු කාරණ සම්බන්ධයෙන් එකී සංසදය කර ඇති නිර්දේශ කෙතරම් දුරට අප ක්‍රියාත්මක කර තිබේදැයි ජුබිලි වසරේ මෙනෙහි කර බැලීම වටිනවා නොවේ ද?

ගරු ඇන්ටන් දිනේෂ් පියතුමා
මීසම් සේවක, මෝදර ශා. ස්නාවක ජුවාම් මුනිඳුන්ගේ දෙව්මැදුර.

# පන්හිඳේ මෙහෙවර නිවී යයි ....

වසර ගණනාවක සිට භක්ති ප්‍රබෝධනය යුග මෙහෙවර තම පන්හිඳෙන් ආලෝකවත් කරන්නට දායක වූ මැද නයිනමඩමේ පද්මලතා ඕබ්‍රිස් මහත්මිය පසුගියදා අප අතරින් වෙන්ව ගිය බව සැලවිය.



ඇය දුන් පන්නරය හා ශක්තිය කිසිවකුට අමතක නොවන්නේ, කාලීනව ලියන ලද නිර්මාණශීලි අදහස් ගොනු වූ ලිපි, කාව්‍ය හා නිසැඳැස් හේතුවෙනි. වර්ෂ 2017 නොවැම්බර් මස භක්ති ප්‍රබෝධනය සඟරාවට ඇය ලියූ ''මගේ මරණය'' නම් වූ පොදු ධර්මතාවය දනවන ලිපිය ඇයට ගෞරවයක් ලෙසට මෙසේ පළකරමු. හමුවෙමු දිනක ඒ ලස්සණ ලොවෙහි අප ! සංස්කාරක පියතුමා, කාර්ය මණ්ඩලයේ අය සමග පාඨක හැම.

රූපස් ප්‍රැන්සිස්

## මගේ මරණය

මිනීවිටිය ශුද්ධ කොට
මිනීවල තනා උස්කොට
සුදුවැලිද අතුරා ඒ මත
මල්වලින් සරසා වටේටම
ඉටිපහන් දල්වා පෙළකට
මළවුන් සඳහා පූජාවට
එක්වුනා හැමෝම අපි_
සිතට දුක දැනුනේ
මියගිය අය වෙනුවෙන්
පමණක්ම නොවේ
කවදා හෝ දිනෙක මමත්
මේ මහ පොළව යට
වැතිරෙන දවසක් ඒවි
නිහැඬින්ම_
නොදැනීම නෙතු අගට
එක් උනේ කඳුලක් හෙමිහිට
මගේ මරණය
දැණුනු නිසයි
හදේ ගැඹුරටම_

එම්. පද්මලතා ඕබ්‍රිස්
මැද නයිනමඩම

# නායකයෝ ..........

නායකත්වය යන සංකල්පය වර්තමානයේ පුළුල් ලෙස සාකච්ඡාවට ලක් කෙරෙන මාතෘකාවක් වශයෙන් හැඳින්විය හැකිය. නවීන තොරතුරු යුගයේදී කණ්ඩායම් ගතව ක්‍රියාත්මකවීමේ අවස්ථා බහුල වී ඇත. විශේෂයෙන්ම වත්මන් ධනවාදී ආර්ථික රටාවත් සමග ව්‍යාපාරික සමාජය හා ගනුදෙනු කිරීමේදී සේම සමාජ සම්බන්ධතා පවත්වාගෙන යාමේදී විවිධ අවස්ථා අනුව එකට එකතුවී කාර්ය ඉටු කිරීමට පුද්ගලයාට සිදුවේ. කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීමේදී අපේක්ෂා සඵල කරගැනීමට නිසි මගපෙන්වීමක්, මෙහෙයවීමක් හේතුවේ. සමාජ ජීවියකු වන මිනිසා පමණක්ම නොව සතුන්ගේ ලෝකයේද විවිධ කණ්ඩායම් නැතහොත් සමූහ වශයෙන් ජීවත් වීමට ප්‍රියතාවක් දක්වයි. මෙසේ එකට එකතුවී කාර්යයක නිරත වන කණ්ඩායම් මෙහෙයවීම සඳහා ප්‍රධානත්වය ගන්නා පුද්ගලයා "**නායකයා**" ලෙස සරලව හැඳින්වේ. නායකත්වය යනු කිසියම් කාර්යභාරයක් සාර්ථක ලෙස අරමුණු කරා යොමු කිරීමේ ක්‍රියාදාමයයි. එසේත් නැතහොත් යම් අවස්ථාවක පරමාර්ථයක් ළඟා කර ගැනීම සඳහා පුද්ගලයන් හෝ කණ්ඩායම් කටයුතු මෙහෙයවීමෙ හා බලපෑම් කිරීමේ ක්‍රියාවලියයි. මේ අනුව සාර්ථක නායකයකු සතුව පහත ගුණාංග සියල්ල තිබිය යුතුය.

1) **ශිල්පීය කුසලතා**. (Technical Skill)

ශිල්පීය කුසලතා යනු - තමාට පැවරෙන යම් කාර්යයක් පිළිබඳව පූර්ණ අවබෝධයක් තිබීමයි.

2) **සංකල්පමය කුසලතා**. (Conceptual Skill)

සංකල්පමය කුසලතා යනු - සංවිධානය සම්බන්ධව විවිධ ගැටලු සහ ඒවායේ මූලයන් පිළිබඳ ග්‍රහණය කර ගැනීමේ හැකියාවයි.

3) **අන්තර් සම්බන්ධතා කුසලතා**. (Interpersonal Skill )

4) **විශ්ලේෂණාත්මක කුසලතා**. (**Analytical Skill** )

5) **විග්‍රහාත්මක කුසලතා**. (Diagnose Skill)

6) **සංන්නිවේදන කුසලතා**. (Communication Skill)

මේ නිපුණතාවලට අමතරව සාර්ථක නායකයකු සතුව තිබිය යුතු ගුණාංග කිහිපයක්ද ඇත .

- නැණවත් බව.
- උපායශීලී බව.
- සත්‍යවාදී බව.
- ඉවසීම .
- පෞරුෂය.
- අවංකකම.
- විශ්වාසවන්තකම.
- ආත්ම විශ්වාසය.

නායකයකු කටයුතු කරන ආකාරය අනුව නායකත්ව ශෛලි කිහිපයක් කළමනාකරණය තුළ විග්‍රහ කළ හැකිය.

1) අධිකාරවාදී ශෛලිය.

මෙහිදී මානව සාධක ගැන වැඩි සැලකිල්ලක් නොදක්වන අතර කාර්ය සාධකය සම්බන්ධව වැඩි අවධානයක් යොදවයි.

2) සහභාගිත්ව නායකත්ව ශෛලිය.

සංවිධාන අරමුණු කෙරෙහි කාර්ය මණ්ඩලය

යොදා ගැනීම මෙහිදී සිදුකරයි. තීරණ ගැනීමේ ක්‍රියාවලියට සේවක මණ්ඩලය සහභාගී කරගනියි.

එමෙන්ම නායකයකු සතු නායකත්ව වර්ග දෙකක් අර්ථ දැක්විය හැකිය. එනම් ,

1) විධිමත් නායකත්වය.

2) අවිධිමත් නායකත්වය.

- විධිමත් නායකත්වය.

පුද්ගලයකුට සංවිධානය තුළ ලැබී ඇති තනතුරට ඔහුට ලැබෙන නායකත්වය විධිමත් නායකත්වයයි.

උදා -: ආයතනයක කළමනාකරු.

- අවිධිමත් නායකත්වය.

පුද්ගලයන් අතර අන්තර් පුද්ගල සම්බන්ධතා මගින් ඇති කරගන්නා නායකත්වය මෙයින් අර්ථ ගැන්වේ.

සාර්ථකත්වයේ හේතු පාඨය නම් නායකත්වයයි. එහෙත් නායකත්වය යන්න අර්ථ කථනය කිරීම අපහසුය. නායකයින් සොයා ගැනීම ද අසීරුය. ඕනෑම මෝඩයකුට අණ දෙන්නකු විය හැකි බවද, පුහුණු මිනිසකු තුළින් බොහෝවිට උපදේශකයකු නිර්මාණය වනු ඇති බවද ගම්‍ය වේ. එහෙත්, නායකයා බොහෝ දුරට කවියකු වැනිය. කවීන් බිහිවනු මිස, නිපදවිය නොහැක.

ගරු. කේ. සුමිත් සමීර ප්‍රනාන්දු සහෝදරතුමා
ජුසේවාස් දේව ධර්ම නිකේතනය
කොළඹ 08

# සැප විතරයි දුක නොදනී

නායකකම ගන්න සැවොම නිතරම පොර කන්නේ
ගන්නා තුරු ඒ තනතුරු සැමට සුහද වන්නේ
ගත් පසු ඒ තනතුර ඔහු කවුරුන් නෑ හඳුනන්නේ
නායකයා වෙලාව වෙන් කර ගත යුතු වන්නේ

සැප විතරයි දුක නොදනී අමුතු ලොවක ඉන්නේ
පයින් ගමන බෑ ලොකු වාහනවල ඉගිලෙන්නේ
හුදු ආටෝපෙට බොරු වියදම් කරන්න රුචි වන්නේ
නායකයන් වූ බොහො අය මෙලෙසයි දිවි ගෙවන්නේ

ගමට, රටට, ජාතියටම නෑ කිසිම දෙයක් වෙන්නේ
තමන්ගෙ මඩි තර කර ගෙන යෙහෙන් සැරසී ඉන්නේ
සමහර නායකයන් වුවොත් සැමට සෙතක් වන්නේ
නියම නායකයන් අසලයි සැමා එක් රැස් වන්නේ

නායකයෝ හොඳ නොවුණොත් නොහොඳක්මයි වන්නේ
දිළිඳුකමට, බැහැපත්කම එක්වූවොත් ශුභ සහනය දුන්නේ
සැබෑ නායකයා ජේසු සැමට සුව සහනය දුන්නේ
කිතුනු නායකයන් වෙමින් අපි ජේසු වගේ වෙමුනේ

**ඩිලීෂියා තිලකරත්න** - දහම් ගුරු - කෑගල්ල

# උස් මිටි කම්...

උස් මිටි කම් නොසොයනා
තරාතිරම් නොබලනා
සැමටම සෙත සලසනා
සැබෑ නායකයෝ වෙමු

තනතුරු ගෙන හිස උදුම්මා
නොගෙන වැඩ කරමුව නිම්මා
ආදර්ශයට ගෙන මරි අම්මා
සිතින් දිළිඳුව බැහැපත් වෙම්මා

ජේසු වගේ හොඳ නායකයෝ වෙමු
අවැසි අය හට උදවු කරමු
ප්‍රේමෙන් දිවි ගෙවමු
කිතුනු නායකකම ලොවට පෙන්වමු

**මනුක වීරසේකර**
පිටකෝට්ටේ

# ජයගත් විශ්වාසය ( කෙටි කතාව )

"සුරංග ඔයාලට අපේ ගෙදරට එන්න කිව්වා. එන දිනේ ඔයාලා කතා කරගෙන මට කියන්න, හොඳේ". "මට නම් හෙටම ඇවිත් ඔයාව ගෙනියන්න පුළුවන්". "ඔයාට තනියම නෙවෙයි අනේ එන්න කිව්වෙ, ගෙදර අයත් එක්කයි එන්න කිව්වෙ". "හරි හරි මම දිනයක් කියන්නම්කො ඒක නෙවෙයි; අම්මා තාත්තා මොකද කියන්නේ ? " "ඔන්න මම හැම විස්තරයක්ම කිව්වා. අපේ තාත්තා අලගිය මුලග ය තැන් ඔක්කොම අහනවනෙ. මම ඉතිං මම දන්න දේවල් කිව්වා. අනික්වා ඔයාලා ආවහම අහගන්න කිව්වා". "ඔයා මොනවද කිව්වෙ ?". ඔයාගෙ උස, පාට, ඉගෙනීම, රස්සාව ඕවනෙ මම දන්නේ. ඔයාගෙ වත් පොහොසත්කම් ඇහුවා මම කිව්වා මට ඒවා අවශ්‍ය නැහැ කියලා. "ඇයි මගෙ ආදරේ තරම කිව්වෙ

නැද්ද ?". "ඒකෙ තරම මම දන්නෙ නැහැනෙ. බැරිද පෙන්නන්න ?". කෝ මෙහාට එන්න පෙන්නන්න" කියමින් සුරංග තම ආදර වන්තිය වන ප්‍රියානිව අල්ලා ගැනීමට සැරසුනි. ඇය වහා දිව ගොස් තම කාර්යාල කාමරයට වැදුණාය. සුරංග සහ ප්‍රියානි එකම ආයතනයේ අංශ දෙකක රාජකාරි කරති. සුරංග අංශ ප්‍රධානියෙකි. ප්‍රියානි පරිගණක ශිල්පිනියකි. ඔවුන් දෙදෙනාගේ ආදර කතාව අවුරුදු දෙක තුනක් පසු පසට දිවෙන්නකි. එහෙත් නිවෙස්-වලට දැන්වූයේ මෑතකදීය. මන්ද ප්‍රියානිගේ වැඩිමහල් සොහොයුරිය විවාහ වන තුරුය. දැන් ඇය විවාහ වී ටික කාලයක් ගත්වී ඇත. ඒ නිසා දෙදෙනම තම සම්බන්ධය නිවෙස්වලට දැන්වූවෝය.

කිහිප දිනකින් සුරංග දෙමාපියන් සහ සිය සොහොයුරියන් දෙදෙනා සමග ප්‍රියානිගේ නිවසට ගියේය. පවුල් දෙකේ හමුවීම ඉතාමත් සුහද විය. දෙපස විස්තර හුවමාරු විය. හැමදෙන සතුටට පත්වූහ. දිවා භෝජන සංග්‍රහයක්ද සූදානම් විය. විහිළු තහළුවෙන් මෙන්ම හාරදූර කතාබහෙන් ද කාලය ගෙවිණ. නංගිලා දෙදෙන ඉතා ඉක්මනින් ප්‍රියානි සමග සුහද වූහ. ඉතාමත් සුහද වූ ඥාතීත්වයකින් දෙපාර්ශවයම බැඳුණහ. සුරංගලා සවස තේ පානයෙන් පසුව වෙන්වී යන මොහොත පැමිණියේය. ගමනට සමුදීමේදී ප්‍රියානිගේ පියා කටහඬ අවදි කළේය. "අපි නම් මේ කටයුත්තට බොහෝම කැමතියි. සුරංග පුතා ගැන අප බොහෝම පැහැදුණා. අපි දෙගොල්ලනගේම පවුල් පසුබිමත් ආගම දහමත් ගැලපෙනවා. අපෙන් කිසිම බාධාවක් නැහැ. මෙයාලා දැන අඳුරගෙන සෑහෙන කලක්ලුනේ. ඉති. තවත් කල් යවන්න අවශ්‍ය නැහැනෙ. පුතාගෙ හඳහන් කොපිය එවන්නකො. කේන්දර ගැලපෙනවද කියලා බලන්න ඕනනෙ". සුරංගගේ දෙමාපියෝ මුහුණට මුහුණ බලා ගත්හ. සුරංගගේ මුහුණ අඳුරු විය. "අනේ මිස්ට ජයකොඩි අපි කේන්දර හඳහන් විශ්වාස කරන්නේ නැහැනෙ. මේ තාක් දුර අපි ආවෙ ඔය කිසිම හඳහනක් බලලා නෙවෙයි. "ඒ උණාට අපි නම් හැම දේකදීම කේන්දරය බලනවා. වෙලාවල් බලනවා. නැකත් ශාස්ත්‍රයට අනුව තමයි අපි විශ්වාස කරන්නේ. අපි හැම දේම කරන්නේ අපිට පහසු අපිට සුදුසු අපට කරදරයක් නැති වෙලාවක් බලලා. අපි නැකත් කේන්දර කිසි දෙයක් විශ්වාස කරන්නෙ නැහැ. විශ්වාස නොකරන දේකට මුල්තැන දෙන්නේ කොහොමද ?". "අපිත් හොඳ කතෝලිකයො තමයි. අපේ පල්ලියෙ මීසම් සභාවෙ අපි ඉහළ තනතුරු දරනවා. ඒත් ඉතිං අපි බැන්දෙත් කේන්දර ගැලපීම් බලලා. සුබ වෙලාවල් බලලා. දරුවෙක්ගෙ හැම කටයුත්තකදීම අපි සුබ නැකතට තමයි වැඩ කරන්නේ. මේ ගෙවල් දොරවල් හැදුවෙත් අපි දෙන්නගෙ කේන්දරවලට අනුව නැකත් බලලා තමයි. ඒකෙන් අපිට දියුණුවක් මිස අවැඩක් වෙලා නැහැ. මගේ මේ ව්‍යාපාර කටයුතු ඔක්කොම පටන් ගත්තෙ, කරගෙන යන්නේ නැකත් වෙලාවල් බලලා තමයි". ප්‍රියනිගේ පියා දීර්ග විස්තරයක් කළේය. එවිටම ඇගේ මවද " අපේ ලොකු දුවගෙ මංගල්‍යයත් කෙරුනෙ නැකත් බලලා. ඒ පුතාගෙ පැත්තෙ අයත් බොහෝම හොඳ කතෝලික අය. ඒත් අපි දෙගොල්ලොම කේන්දර බලලා තමයි කටයුතු කළේ. ඒ දෙන්නගෙ කේනදර වල පොරොන්දම් සීයට අසූවක්ම ගැලපුණා. ලොකු දුවට ආව මංගල යෝජනා කීපයක්ම කේනදර නොගැලපීම නිසා

අත හැරුණා. අනේ තරහ වෙන්න එපා, අපි සුරංග පුතාට කේන්දරයක් හදමු. උපන් වෙලාව දෙන්නකො අපි හදවන්නම්. අපිට වැඩ කරන හොඳ දක්ෂ දෛවඥයෙක් ඉන්නවා. එයා තමයි අපේ හැම වැඩක්ම කරලා දෙන්නේ" යයි පැවසීය. "ඔව් ඔව් විවාහය වගේ වැදගත් තීරණ ගනිද්දි ඒවා අතපසු කරන්න බැහැ. ඔයාලා කතා බහ කරලා අපිට කියන්නකෝ" යයි ප්‍රියානිගේ පියා අවසාන තීන්දුව දුන්නේය. මේ අවසාන මොහොතේදී හැමෝගේම හදවත් වලට අඳුරක් එක් කරමින් දෙපාර්ශවය වෙන්වූහ.

වාහනයේ එන ගමන් පස් දෙනාගේ නිශ්ශබ්දතාවය බින්දේ අම්මාය. "අනේ පුතේ බලන්නකො අපි මේ තාක් කල් විශ්වාස නොකරපු දේකට මුල්තැන දෙන්න පුළුවන්ද නේද ?" "ඒක තමයි දැන් බලන්න මෙතන හැමදේම ගැලපෙනවා. හැම කෙනාම ගැලපෙනවා. අපි දෙගොල්ලම කොයි තරම් සතුටකින් සුහද කමකින්ද එහෙ ගතකළේ. ඒත් මේ අනවශ්‍ය කුණු ගොඩක් අන්තිම මොහොතෙ මතු උණානෙ" යනුවෙන් තාත්තා වික්ෂෝප විය. "පුතාගේ උපන් වෙලාවවත් මට මතක නැහැ. මෙතෙක් කල් උවමනා උණේ දිනෙයි මාසෙයි අවුරුද්දයි විතරනෙ". "අම්මලා මේ ගැන ඕනෑවට වැඩිය හිතන්න එපා. අපි විශ්වාස නොකරන දෙයක් අපේ ජීවිතයට ගන්න ඕනෙ නැහැනෙ. පුහු විශ්වාසය නිසා අපේ ජීවිත අඳුරේ දමා ගන්න ඕනෙ නැහැනෙ". ඔව් පුතා ඔයා හරි. දෙවියන්වහන්සේ හරි දේ තෝරලා බේරලා දෙයි. අපි හරි තීරණයක් නෙ ගත්තෙ. අපේ විශ්වාසය බිඳ ගන්න ඕනෙ නැහැනෙ. ඔයාලා ස්ථිර විශ්වාසයකින් ඉන්න. පුතා, ඒ දරුවා කනගාටුවෙන් ඇත්තෙ. ඔයා පහදලා දෙන්න. දේව විශ්වාසය හැම දේටම වඩා බලවත් කියලා. ඔය දෙන්න වෙන් වෙන්නත් එපා. ස්ථිර තීරණයක ඉන්න. හැම දේම හරි වෙලාවට විසඳෙයි. මට විශ්වාසයි". තාත්තාගේ මේ වචන සුරංගගේ සිත ශක්තිමත් කළේය. " ඒ අක්කා හරිම හොඳයි අම්මෙ. අපි ගියානෙ එයාගෙ කමරේට හරි ලස්සණයි ඒ කමරේ" එක් සොහොයුරියක් පැවසුවාය. එවිටම අනික් සොහොයුරිය "ඔව් ඔව් අපි ගොඩාක් යාළු උණා. හරිම හොඳයි. අයියා කොහොම හරි ඒ අක්කව බඳින්න. බැරි උණොත් එයාලගෙ අම්මලට හොරෙන් ඔය දෙන්නා පැනලා යන්න" යයි කීවාය. "අනේ අනේ පොඩි දුව කියන දේවල් හරි ෂෝක්. ගෑනු ළමයි කතා කරන විදිහ. නෑ නෑ ඒ දෙමව්පියන්ට ගින්දර දීලා ඔයාලට සතුටු වෙන්න බැහැ . වැදගත් දරුවො ඔය විදිහට හැසිරෙන්නෙ නැහැ" අම්මා බාල සොහොයුරියට තරවටු කළාය. "අපි බලමුකො, මට හදිස්සියක් නැහැ කසාද බඳින්න. කාලයා ප්‍රශ්න විසඳයි. මෙහෙම ප්‍රශ්නයක් එයි කියලා අපි හිතුවෙ නැහැනෙ" සුරංග කීවේය.

කාලය හෙමිහිට ගලාගෙන ගියේය. දෙදෙනාගේ ආදර සම්බන්ධය තව තවත් ශක්තිමත් වූණා මිස කැඩී බිඳී නොගියේය. සුරංගගේ දෙමව්පියන්ගේ ආශීර්වාදය නම් ඔවුන්ට නොමඳව ලැබුණි. කේන්දර අමතකකර, දෙමාපිය අවසරය ඇතිව විවාහ වන්නැයි ද ඔවුනට කීහ. ප්‍රියානිගේ දෙමාපියෝ සුරංගට කැමතිය. සුරංගගේ දෙමාපියෝ, පවුල් පසුබිමට කැමතිය. ඔවුන්ගේ පූර්ණ කැමැත්ත දීමට ඇති එකම බාධාව කේන්දරයයි. සුරංගගේ පවුලේ අය කේන්දර බැලීමට අකමැති වීමයි.

මෙලෙස කාලයක් ගත විය. ප්‍රියානිගේ පක්ෂයෙන් කිසිදු බුරුලක් පෙන්වන්නේ නැත. සුරංගගේ පාර්ශවයද ඔවුන්ට අවනත වන්නේ නැත. අහිංසක පෙම්වතුන් යුවල මෙයින් පීඩාවට පත්වූහ. එහෙත් දෙදෙනම ස්ථිරව බැඳී සිටියෝය. මේ අතර ප්‍රියානිට විවාහ යෝජනා කීපයක්ම ඇගේ දෙමාපියෝ ගෙනාවෝය. ඒ හැම එකකටම ඇය අකමැති වූවාය. මේ නිසා දෙමාපියන්ගේ දෝෂ දර්ශනයට ඕ බඳුන් වූවාය. මෙවන් විස්තර සුරංග සමග කියද්දී ඔහු කියන්නේ; "ඉවසන්න ඉවසන්න විශ්වාසයෙන් ඉන්නකෝ. අපට වරදින්නෙ නැහැ" කියාය. "එතකොට වෙන්න ඕනෙ දේ වෙලා ඉවරයි. හැරමිටියෙන් යද්දි තමා අපිට බඳින්න වෙන්නේ" යයි ප්‍රියානි කේන්තියෙන් කියද්දී සුරංග විහිළුවකින් ඇගේ කේන්තිය නිවා දමයි. එහෙත් සුරංගගේ වචනය විශ්වාස කරගෙන ඇය නිහඬ වෙයි.

දිනක් ප්‍රියානි උදෑසන කාර්යාලයට පැමිණ විගසම හිනා කටක් පුරවාගෙන දුවගෙන විත් සුරංගගේ අතේ එල්ලුණාය. "මොකද මොකද අද මේ මෙච්චර සන්තෝසෙකින්" ? ඔයාට සුබ ආරංචියක් තියෙනවා කියන්න". "ඇයි මොකද ඔයාට ලොතරැයියක් වත් ඇදුණද" ? "ඔයා කිව්ව

දේවල් හරියාගෙන එනවා. ඔයගෙ විශ්වාසය පල දරාගෙන එනවා". "මට තේරුණේ නැහැ". "ඉවසීමෙන් සැනසීම ලැබේ. ඉවසන දනා රුපු යුදයට ජය කොඩිය කියලා තියෙන්නෙ කට කහනවාටයැ". "ප්‍රහේලිකා පුරවන්නෙ නැතිව කියන්නකො". "අපේ අක්කා අයියත් එක්ක රංඩුවෙලා ගෙදර ආවා". "ඔයා මාර නංගියෙක්නෙ. අක්කයි අයියයි තරහ වෙලා වෙන්වෙලා ආවට ඔය තරං සතුටුවෙන්නේ ? පුදුම නංගියෙක්නෙ අඬන්නනෙ ඕනෙ". "නෑ නෑ ඔයාට තේරුණේ නැහැ. මට දුකයි තමයි. අම්මලට ඊට වඩා දුකයි. ඒත් මේක අහන්නකො. අපේ අක්කා හරිම අහිංසකයි". "ඔව් ඔව් ඔයා වගේ රංඩු කෙක්කක් නෙවෙයිනෙ". "අනේ මේක අහන්නකො. අපේ අක්කයි ඒ අයියයි නිතරම රංඩු වෙනවලු. අයියා හරියට බොනවලු. බීලා ඇවිල්ලා අක්කට ගහනවලු. වද දෙනවලු. බොරු දේවල්වලට රංඩු පටලවා ගන්නවාලු. ඒ වෙලාවෙදී අයියගෙ අම්මත් ගන්නෙ පුතගෙ පැත්තලු. අක්කටම දොස් කියනවලු. මිනිහා හදාගන්න දන්නේ නැහැ කියලා. අපේ අක්කා ඉතිං ඔලුව පාත්කරගෙන ඉන්නවලු. බැරිම තැන තමයි ගෙදර ඇවිත් තියෙන්නෙ. ඇඟ හැම තැනම නිල් වෙලා. අපේ අම්මලට තාත්තලට හරිම දුකයි. කේන්තියි. හැබැයි මම ඇහැව්වා සීයට අසුවෙ පොරොන්දමට මොකද උණේ කියලා". "තාත්තා බැන්නේ නැද්ද" ? "නෑ නෑ මට බැන්නේ නැහැ නැකත් බලපු මිනිහට බැන්නා". "ඉතිං දැන් මොකද තත්වෙ ? ආයෙ සමාදාන කරන්න බැරිද" ? "අනේ සුරංග අවුරුදු විසි හතක් අටක් අම්මලා එක්ක ඉන්දැද්දි එයාලට පුතාව හදාගන්න බැරි එකේ අපේ අක්කා අවුරුද්දෙන් දෙකෙන් කොහොමද මිනිහෙක්ව හදන්නෙ ? ඒත් ඉතිං තාත්තා කිව්වා මොනවා හරිකරලා සමාදාන කරන්න ඕනෙ කියලා". "ඒක හරි. දැන් කියන්න ඔයා ඔය තරම් සතුටු වෙන්නෙ මොකද කියලා" ? "අක්කා ඉතිං අඬ අඬා ඉන්නවා. අම්මත් අඬ අඬා අක්කව සනසවනවා. ඔය අතරෙ අපේ තාත්තා නැකත් කාරයට බැණ බැණ; ඔයාලට එන්න කියන්න කිව්වා. ඔයාලගෙන් සමාව ඉල්ලන්න ඕනෙ කිව්වා, එදා හිත් රිදවීමට". "ඒවා ගණන් ගන්න එපා කියන්න. අපි අද හෙටම එන්නම්".

"ඔව් අපේ වයස යනවා කියලා ඉක්මනින් දිනයක් දාගම්මු කිව්වා". "ඒකනේ මම කිව්වෙ, හැම දේටම වඩා විශ්වාසය බලවත් කියලා. ඔය හඳහන් බැලුවෙ නැතුවට ඔයා බයවෙන්න එපා. මේ දැන් වගේම මම හැමදාම ඔයාට ආදරෙයි. මම ඔයාට දුකක් නොදී හැමදාම ආදරෙන් බලාගන්නවා". "ඔව් ඒක මම දන්නවා ඒ නිසානෙ එක හිතින්ම ඔයාව පතාගෙනම හිටියෙ" යැයි ප්‍රියානි කියත්ම සුරංග ප්‍රියානිව තුරුලු කර ගත්තේය.

**ඇග්නස් චන්ද්‍රකාන්ති ජයමාන්න**

# අජිම හිතැති නායකයෝ

අම්මා අප්පා අක්කා අයියා මේ අහගන්න
මාමා නැන්දා මල්ලි නංගි හැමදෙන දන්න
කිරි පැණි පිරි සුන්දර මව් බිමක් හදන්න
දුක් දැනෙණා හිතවතාව රජ කරවන්න

එන්න එන්න මෙන්න ගන්න අප දෙන ඒවා
අනිත් ඇයො වගේ නොවෙයි හොඳ හොඳ ඒවා
අප දෙන්නේ හොඳ පොරොන්දු ඇත්තම ඒවා
කතිරෙ තමයි අපට ඕනෙ කරන්නට මේවා

නායකයා කොයිවගේද කියා දුන්නෙ ජේසු
අපේ රටේ නායකයන් යන්නේ පිටින් අසූ
දෙව් රජිඳුන් අපට දුන්නු තිළිණය පුත් ජේසු
උදේ හවා අපි නමදිමු එකම රජිඳු ජේසු

දූ පුතුන්ගෙ අනාගතය නිති රැකගන්න
පරිසරයට පණමෙන් ආදරය කරන්න
අපේ පුංචි දේශය සාමෙන් පුරවන්න
දේව පියේ යහගුණ ඇති රජකු එවන්න

**අයිරින් කොස්තා - කඳවල**

# රටම හැරවිය යුතුය......

කා ච ස ත

එකම රෙද්දෙන් කැපුණ
එකම විදියට මැහුණ
කසළ බෝනික්කො ගොඩ
දියවන්නාවෙ ගොඩගැසුණා

හැත්ත පස් වසරක්ම
කරුම තෝරපු පවට
නිවැරදිම නායකයො
අහිමි කෙරුවෙම අපය


ජන්දෙකදී මට බෙදන
ටකරමට ලොබබැන්ද
රටක් ගැන නොම සිතුව
අපිට උණදේ මදිය

පුරුදු සලකුණ බලා
යළිත් නොරැවටෙම් කියා
රටම හැරවිය යුතුය
සාධාරණය කරා...



චමත් බී. පයාගල
කටුකුරුන්ද කළුතර

## අමිතගේ හද ගැස්ම......



# THE PURPOSE OF LIFE

Life must begin with God. You are born by His purpose and for His purpose. This is the truth.

Bertrand Russell, an atheist said, "Unless you assume a God the question of life's purpose is meaningless."

Every Christian is called to salvation. It is our spiritual calling. Salvation has already been won for us by Christ through the Holy Cross. It is now a question of safeguarding and maintaining this salvation through the way we live. Then we have a calling to a profession or a service. These two callings are inseparable. The first informs you how you should live and the second, where lies the purpose of God for you.You are free and independent to choose your partner in life, your line of education, your means of earning etc. but only God knows the purpose for which you have been born.

Whenever we need to know the purpose of any new invention, we always ask the inventor. In the same way you must ask God, your Inventor, for your purpose in life. God need not come down to tell you that but you need to grasp it through your personality traits and the circumstances around you.

Scripture says that the purpose of your life predates even your own conception. Every child is a plan of God and God has a specific unique plan for you. In that there are no illegitimate children. Even the child born out of wedlock is a child of God and He has a specific plan for that child. He has created everyone out of love and to love Him alone. Unless you grasp this, life will not make any sense. You may have a special talent for music or a skill to explain difficult topics or you may be in a situation where people need some consolation and you may be good at counselling. Whatever it may be, we are called to be a service provider and that may be your life's purpose. "For God chose every one of us in His Son, before the creation of the world, to be holy and blameless before Him" Ephesians: 1:4 As a diamond reflects beautiful and vibrant colours, so too your personality reflects God's light in variety of facets. If you conduct your affairs in life in a manner consistent with your God-given personality, you will definitely experience fulfillment in life. You have then lived up to your life's purpose.

God is so just that He equips you with everything you require to perform His will achieves His purpose. No one can argue that one has no potential. "I have filled you with the spirit, wisdom, understanding and knowledge and all kind of skills to carry out my command'' Exodus 31:3-5. God knows what is best for you. He will not equip you with anything that does not serve His purpose. He will not waste His gifts. Therefore, be happy with what you have. Do not compare your potential with somebody else's. You are unique. Never complain over your appearance, skin colour or status. You possess just the best. There is no argument over that. This way of thinking leads you to live peacefully and joyfully.

God will never expect you to dedicate your life towards a task for which you have no potential. On the other hand, your strong skills and capabilities are a clear indication of what God expects of you. If you cannot play a tune on the piano or cannot sing a note God will never expect you to be in charge of the church choir.

God's purpose for you is not limited

by your past. We can talk about many great characters whose past has been pathetic. Moses was short tempered, he stammered and even was guilty of murder but ended up being the Father of a great nation. Peter was weak-willed, impulsive and betrayed Jesus, but the keys of heaven were entrusted to him and he became the Rock. Mat 16:18.

Mary Magdalene was a prostitute but had the singular honour of witnessing the Resurrected Christ before everyone else. Your past failure will not affect your future and should not obstruct you from achieving your purpose in life. Always remember that failure is not the opposite of success but it is part of success. Failure at some point in life may be inevitable but giving up will be regrettable.

Our certain shortcomings can be obstacles. Anger and resentment must always be short-lived. Never internalize your anger. The truth is that resentment hurts you more than the one you resent. An internalized anger will burn you from within and so is jealousy. Fear can obstruct you from achieving your purpose. Fear is a self-imposed prison. It is a wall that obstruct your forward movement. Materialism can be very destructive. The less wealth and possession you have, the easier it is to achieve God's purpose. Scripture is very clear and advises us very sternly, never to love worldly possessions, '' That would be eaten by moths and worms but to amass heavenly treasures that are everlasting'' (Mat 6:19). Never be amused by worldly possessions. No one has all the keys to success but surely one key to failure in reaching God's purpose is to fall in love with the world. The lesser you possess, the happier you would be. Unfortunately, a great many refuse to accept this.

Recall Noah's life. He was a total amateur to ship building, let alone having ever seen a ship or the ocean; but he trusted God and obeyed Him when asked to build the ship. His ship lasted at least for forty days and nights but the Titanic that was built with the latest technology of that time and with the title "The Unsinkable" was destroyed at her maiden voyage. God's ways are marvelous. On your own, you may not achieve much, but with you and God working together, nothing is impossible. Your success is in God's hand. You may propose so many suggestions but if it is not God's proposal, in vain will you toil. God's blessings will flow constantly for you, but, how much you receive depends on how much your heart believes.

When you consider many of the miracles Jesus had performed He always said to the recipient.

"Your faith has made you well''

"The scripture says where your treasure is, there your heart be also"- Mat 6:21. Whatever the activity, you surrender yourself whole heartedly to, is that, which your purpose becomes.

At the intersection of all your talents, skills, capabilities, gifts and your passion lies God's purpose for you.

Living a purposeful life is the duty of everyone who believes that God is at the helm of affairs.

Avoid then all obstacles to a purposeful life, never be afraid. God's grace will increase and multiply and He will equip you with all you require. Be hopeful and place your trust in God and obey only the dictates of your clear conscience. Be in the world but do not be of the world. Always believe that '' My Grace is enough for you''

**Christopher Perera**

St. Peter's College – Colombo 04,
Negombo Branch

## සේවකත්වයේ නායකයා ජේසු

මිනිසුන් අතර මිනිසකු ලෙස  දිලෙන්නට
යහගුණ වැළඳ ලොව ලස්සණ  කරන්නට
සේවක නායකත්වයෙ ජය  ලබන්නට
ජේසුගෙ මඟට පිවිසෙමු දිවි  දිනන්නට

යහපත රජයන්න මුළු ජන  සමාජයේ
පැවැත්ම සදන්නට සම බර  විලාසයේ
සාධාරණය රජ කරවන  දිවා රෑයේ
නායකයන් ඇවසි යුග දොර  ඇරීගියේ

ශ්‍රාවක සැමගෙ නායකයා වූ  ජේසු
ඒ සැමගේ දෙපා සෝදා ලූ  ජේසු
සැම යහපතේ ප්‍රතිමූර්තිය වූ  ජේසු
සේවකත්වයේ නායකයයි  ජේසු

නායකකමට ආසයි බොහො  මිනිස්සු
එය ලැබ ගන්න වලිකන්නේ  නොමිනිස්සු
යුතුකම හොඳ නරක නොමදත්  මිනිස්සු
දඟලන මුංට නම් දැන් හොඳටම  පිස්සු

යහපත ගුණ දහම පැවතිය යුතුය  රටේ
උගත්කමට අද තැන නැත අපගේ  රටේ
හැත්තෑපස් වසක් රට දැමු මකර  කටේ
නරුමයො නායකත්වෙට පොර බදින  රටේ

රට දැය සමය නිති සුවපත්  කරන්නට
සම්පත් සමව ජනතාවට  බෙදන්නට
සාමය සතුට තුළ දිවි මග  ගෙවන්නට
මෙහෙවන නායකයො අද නැත  පෙනෙන්නට

කල දුටු කලට වළ ඉහගන්නට  බලන
තම මඩියටම සැම සැප සම්පත්  හලන
නායකත්වයේ පම්පෝරියෙ  වෙළුණ
පලවා හරින දින ඇත අත ළඟ  ඔන්න

බෙනී ජයමාන්න

## යක්ෂ සැලැස්ම

සපුගස්කන්දේ රංජිත්

දේව සැලැස්ම හෝ දේව කැමැත්ත යනු අයහපත යහපතට හැරවීමේ ලෝක ස්වභාවය වේ. යක්ෂ සැලැස්ම හෝ යක්ෂ කැමැත්ත යනු යහපත අයහපතට හැරවීමේ ලෝක ස්වභාවය වේ. සියල්ල සිදු වන්නේ දේව සැලැස්ම අනුව නොවේ. දේව කැමැත්ත මොලොවෙහිත් ඉටු වේවා යනුවෙන් දැහැමියන් පතන්නනෙත් ඒ වෙනුවෙන් ඔවුන් කැප වන්නෙත් ඒ නිසා ය. ආදම් ඒව තහනම් ගෙඩි කෑම දේව කැමැත්ත විය නොහැක. ක්‍රිස්තු ඝාතණය දේව සැලැස්ම විය නොහැකිය. ආගමික ආධිපත්‍යය නිදහස් චින්තකයන්ව ඝාතනය කිරීම දේව සැලැස්ම විය නොහැකිය. පාස්කු බෝම්බය දේව සැලැස්ම විය නොහැකිය.

ජුදාස්, පරිසිවරුන් සහ පූජකවරුන් ඉටුකළේ යක්ෂ සැලැස්ම මිස දේව සැලැස්ම විය නොහැකිය. ශාස්තෘවරු දල්වන ධර්මාලෝකය මුවා කරනු පිණිස උන්වහන්සේලාව මරා හෝ මර්දනය කර උන්වහන්සේලාව වර්ණනා කරමින් උන්වහන්සේලාට වැඳුම් පිදුම් පුද පූජා පැවැත්වීම් යක්ෂ සැලැස්ම මිස දේව සැලැස්ම විය නොහැක. ශාස්තෘ ගුණය සඟවනු පිණිස ශාස්තෘ බැතිය ඉස්මතු කිරීම යක්ෂ සැලැස්ම මිස දේව සැලැස්ම විය නොහැකිය.

පුද්ගලයා තුළ සහ පුද්ගලයන් අතරත් ආගම් තුළ සහ ආගම අතර ක්‍රියාත්මක වන්නේ දේව කැමැත්ත සහ යක්ෂ කැමැත්ත අතරවන සදාතන අරගලය වේ. යක්ෂ සැලැස්මේ ක්‍රියාකාරිත්වය ඔබ සහ මා ඇතුළු සැම අයකු තුළත් සැම ආගමක් තුළත් සැම යහපතක් තුළත් සැම වාසනාවක් තුළත් සැඟවී පවතී. දේව වචනය සහ බද්ධ වචනයත් යක්ෂ සැලැස්ම මගින් අපයෝජනය කරනු ලැබේ. යක්ෂ සැලැස්ම ගැන අප විමසිලිමත් නොවන තරමට දේව සැලැස්ම ඉක්මවා යක්ෂ සැලැස්ම රහසින් බලවත් වේ. ආගමාලයෙන් ජාත්‍යාලයෙන් සහ තමන් නිවැරදිය යන මානයෙන් මනුෂ්‍යයන්ව මත් කරන්නේ යක්ෂ සැලැස්මයි.

සියල්ල සිදු වන්නේ දේව සැලැස්ම අනුව නොව මනුෂ්‍ය ස්වභාවය සහ ලෝක ස්වභාවය අනුවය. ඒ ගැන වූ අපේ අවදිවීම අප තුළ යක්ෂ සැලැස්ම දුබල කරයි. ප්‍රජාතන්ත්‍රිය වූ ශිලාචාර සංවාදය මානවයාගේ චින්තනය පුළුල් කර යක්ෂ සැලැස්ම දුබල කරයි.

# ඕං එහෙනං



සූරිය මාමා

## මෙහෙමත් නායකයෝ....

ඡන්දෙට ගොඩවන අට්ටාලයෙ සිට මරණෙට එන යන මඟුලට එන යන නායකයෝ
දිගඑලි කරන්න නූල් ඔතාගෙන රට වට යන අපේ නායකයෝ
කාටත් ළංවනු බැරිවන තරමට රථ ගාලයෙන් යන නායකයෝ
දුක නාඳුනන උන් තෙත ඇති පපු නැති අපේ නායකයෝ

වැලිගොඩ දාගෙන කැලෑ කපාගෙන සොබා දහමේ මරු නායකයෝ
වහලුන් කරන්න සහන මලු බෙදන්න කරපිට නගිනා නායකයෝ
ජනතා මුදලින් බිල්ට්ක ගෙවලා සැප පිට රට යන නායකයෝ
ලූනු ගෙඩියෙනුත් ගේමක් ගහගෙන පොල්තෙල් බී ගත් නායකයෝ

බෙහෙත් පෙත්තෙනුත් සිරිලිය පරදන කෙහෙළිය වගේ අපේ නායකයෝ
රෝහල් අසලම මල් ශාලා ඇති බව මතකය රඳවන නායකයෝ
බදුබර වැඩිකර කුස පොත්තට හැර බුදුබණ දෙසනා නායකයෝ
දවසට වරුවක් කන්න බැරිතරම් ජනදුක හඳුනන නායකයෝ

අත්තෙන් අත්තට පැන පැන යන කොට තෙමිලා නහිනා නායකයෝ
කතිර යුද්ධයක් ළඟ ළඟ එනකොට දුර පනිනා අපේ නායකයෝ
හැත්තෑ හයකින් කරන්න බැරි වී බංකොලොත් වුණා අපේ නායකයෝ
ආයෙත් රට හදන්න දෙන්නලු පුල්ලි වෙනස් නැති නායකයෝ

සිසුන්ට ගුරු මව්පියන්ට වතුර ගහපු අපේ නායකයෝ
වැස්සකටවත් පාසල් ගොස් නැති හිස් ඔලු ඇති අපේ නායකයෝ
රටක් කරන්නට රටක් හදන්නට සබයට අප යැව් නායකයෝ
සුලුදිය පහකර බූ වල්ලක් ගෙන එළවා ගමු අපි නායකයෝ

නායකයා සේවකයා විය යුතු බව ලොවට දෙසූ වී නායකයා
සතුරු මිතුරු සැම එක ළඟ හිඳවා පා සේදූ අපේ නායකයා
පැත්ත දකුණ කම්මුලට ගැසූ විට වම්පැත්තත් හරවන්නයි කී නායකයා
නාසරතයේ ජේසු කී වදන් පිළිපැද්දොත් නායකයන් හරි නායකයා

# පුංචි විකුම්

## ළමා ප්‍රබෝධනය



### කවුරුද කවුරුද දැන් ලොක්කෝ ...

ඒ ලස්සණ පුංචි ගමක්. වැටවල් ගහලා මායිම් බෙදලා නැති, ඕනෑම වත්තක, ඕනෑම ගෙදරක ඕනෑම දරුවකුට ඉඩ තියෙන, හවස් යාමෙ සෙල්ලමට වැටෙන දරුවෝ ගැන අම්මල තාත්තල බය නොවුණු, ඕනෑම දරුවෙක් තමන්ගෙ දරුවෙක් කියල ගමේ හැමෝම හිතපු හරි අපූරු ගමක්. ඒ නිදහස සහ ආදරය මැද හැමදාම හැන්දෑවට සෙල්ලමට එකතු වෙන පුංචි ළමයි කණ්ඩායමක් හිටියා. මේ සෙල්ලම් නඩයේ නායකයා වුණේ බින්දු.

බින්දු තමයි තීරණය කරන්නෙ අද මොකක්ද කරන සෙල්ලම? අද කොතැනද සෙල්ලම් කරන්නේ? අද සෙල්ලමේ නීති රීති මොනවද? අද සෙල්ලම අවසන් කරන්නේ කොතැනින්ද? මේ හැම දෙයක්ම තීරණය කරන්නෙ බින්දු. මොකද බින්දු ළඟ තමයි ගොඩක් සෙල්ලම් බඩු තිබුණේ. අනික එයාලගෙ වත්තෙ තමයි සෙල්ලම් කරන්න ගොඩක් ඉඩ තිබුණෙ. බින්දු පවුලෙ එකම ළමයා නිසා එයා තනි තීරණ ගන්න තමයි පුරුදු වෙලා තිබුණෙ.

මේක සෙල්ලම් නඩයට වෙලාවකට හරිම කරදරයක්. මොකද සමහර වෙලාවට බින්දු කියනවා 'අද අපි කරන්නෙ ගස් කන සෙල්ලම, ගෑනු ළමයින්ට වේගෙන් දුවන්න බැරි හින්ද එයාල ඉන්න ඕන ගහ රැකගෙන. අපි විතරයි දුවන්නෙ' කියල. සමහර සෙල්ලම්වලට එයා ගැහැනු ළමයින්ව ගන්නෙම නෑ. එයාල අතර හිටියා කතා කරන්න බැරි අවුරුදු පහක විතර මල්ලියෙක්. බින්දු ඒ මල්ලිව කොච්චරවත් පැත්තකට කරනවා එයාට මොනවත් බෑ කියලා. නරකම දේ තමයි සෙල්ලමේදි බින්දු ඉන්න පිල පැරදුණොත් හෙම එයා හොඳටම කේන්ති අරන් එයාගෙ සෙල්ලම් බඩුත් අරගෙන ගෙදර යන එක.

මේ නායකකම නම් හරියන්නෙ නෑ කියල යාළුවෝ හැමෝම කතා වුණා. හොඳ නායකයෙක් කියන්නෙ යහපත් අරමුණකින් හැමෝම එකමුතු කරගෙන සාමූහිකව කරන වැඩවලට මග පෙන්වන කෙනාටනෙ. එයා තමන් නායකයා කියලා අනිත් අයව පහත් කරල සලකන කෙනෙක් වෙන්නත් බැහැනෙ. නායකයට අනිත් හැමෝටමත් වඩා ඉවසීම තියෙන්න ඕනි. එයා තමන්ගෙ කණ්ඩායම තුළ භේද ඇති කරන කෙනෙක් නොවී හැමෝටම ආදරය කරන කෙනෙක් වෙනව නම්නෙ හොඳ. 'බින්දු' අපේ සෙල්ලම් නඩේට හොඳ නායකයෙක් නෙවෙයි, යාළුවො කතා වුණා. ''අපි මොකද කරන්නේ?'' බින්දුව හොඳ නායකයෙක් කරන්න නම් පුංචි පාඩමක් උගන්වන්න ඕන. සෙල්ලම් නඩේ යාළුවො කතා වෙලා සතියක්ම සෙල්ලම් කරන්න ගියේ නෑ. එයාල ගෙවල්වලට වෙලා පොත්පත්වල වැඩ කළා. බින්දු බෝලෙයි, බැට් එකයි, එයාගෙ වීඩියෝ ගේම්සුයි අරන් ගෙදරින් ගෙදර ගියත් කවුරුත් සෙල්ලම් කරන්න ආවෙ නෑ. බින්දුට මුලින්ම හරි තරහයි. පස්සෙ හරි දුකයි. පාළුයි. එයා කල්පනා කළා ඇයි කවුරුත් එන්නෙ නැත්තෙ කියලා.

ඔන්න සති දෙකකට පස්සෙ අර කතා කරන්න බැරි මල්ලි විතරක් බින්දු එක්ක සෙල්ලම් කරන්න ගියා. ඊට ටික දවසකට පස්සෙ මලිති, සඳලියි, ඇනුයි ගෑණු ළමයි ටිකත් සෙල්ලම් කරන්න ගියා. දැන් බින්දුට කියන්න බැහැනෙ එයාලව ගන්නෙ නෑ කියලා. එයාල විතරනෙ ඉන්නෙ. ඔන්න සතියක් විතර ඒ අය එක්ක විතරක්ම සෙල්ලම් කරන්න සිද්ධ වුණා. එතනදි බින්දුට වඩා නායකත්වය ගත්තෙ මලිති. මලිති හැමෝම එකතු කරගෙන සෙල්ලම් කරන විදිය බලන් ඉද්දි බින්දුටත් හිතුණා මමත් එහෙම කළා නම් හොඳයි කියල. දක්ෂ අදක්ෂ කියල බෙදීමක් නෑ. ගැහැනු පිරිමි කියල බෙදීමක් නෑ. හැමෝටම සෙල්ලමේ ඉඩක් තියෙද්දි හැමෝම සතුටින්. ඉන් පස්සෙ දවසින් දවස අනිත් යාළුවොත් ආවා. දවසක් සෙල්ලම් කරල අවසානයේ හැමෝම පිට්ටනියෙ වාඩි වෙලා යාළුවො ටික කතා වුණා ඇයි එයාල එහෙම කළේ කියල. බින්දු නම් ඒ වෙන කොටත් තේරුම් අරගෙනයි තිබුණෙ එයාගෙ අඩුපාඩුව මොකක්ද කියල. ඉතින් බින්දුම යෝජනා කළා මෙහෙම.

''අපි මාසෙන් මාසෙට එක එක අයට සෙල්ලම් නඩේ නායකකම දෙමු. එතකොට අපිට වෙනස් සෙල්ලම් කරන්නත් ලැබෙනවා. අලුත් දේවල් ඉගෙනගන්නත් ලැබෙනවා. හැමෝටම හොඳ නායකයෙක් වෙන්න අත්දැකීමකුත් ලැබෙනවා.''

යාළුවො බොහොම සතුටින් ඒ අදහස අනුමත කළා.

තරු නැන්දා

## ප්‍රහේලිකා අංක - 81

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | | 2 | | 3 | 4 | ■ | 5 | | 6 |
| | ■ | | ■ | 7 | | | | ■ | |
| 8 | 9 | | 10 | | ■ | ■ | | ■ | |
| 11 | | ■ | | ■ | 12 | ■ | | ■ | |
| 13 | | | | | | ■ | ■ | 14 | |
| ■ | ■ | ■ | | ■ | 15 | 16 | 17 | ■ | ■ |
| 18 | 19 | 20 | | ■ | 21 | | | | 22 |
| 23 | | | ■ | 24 | ■ | 25 | | ■ | |
| | ■ | | ■ | | ■ | ■ | ■ | 26 | |
| ■ | 27 | | ■ | 28 | | | ■ | 29 | |

පහළට

1. පෙරදිග ලෝකය සහ බටහිර ලෝක සම්බන්ධ කෙරුණු වෙළඳ මාර්ගය .
2. කැපූ ගොයම් එකතු කරන ස්ථානය.
3. තමන්ට වඩා උසස් කෙනකුගෙන් ලැබෙන විශේෂ අවසරය.
4. "කීර්තිය"ට සමාන වචනයකි.
5. දෙහි වෙනුවට ආහාර පිසීමේදී භාවිත කළ හැකි ආදේශකයකි.
6. ක්‍රිස්තුස් වහන්සේගේ නායකත්වයේ පූර්වාදර්ශයකි.
9. ග්‍රාම නිලධාරීගේ රාජකාරී ප්‍රදේශය.
10. ගල් කැටයම් නෙළීමට භාවිතා කෙරෙන උපකරණය.
12. නායකයකු සැමවිටම කලබල නොවී ක්‍රියා කළ යුතුය. ඒ සඳහා ඔහුට අවශ්‍ය ........
16. නායකයකු සතු විය යුතු දෙයකි.
17. "කැලය"ට සමාන වදනකි.
18. දුම් පටලයක් ලෙස සැකසුණු ඉතා සියුම් ජල වාෂ්ප.
19. ජනප්‍රවාදයේ පවතින මිනිසුන්ට අයහපත් නොකරතියි විශ්වාස කෙරෙන යකෙක්.
20. මුවාගේ ගැහැනු සතා
22. පෙම් හබයක පැටලී, දිවි නැතිකරගත්, නුවර යුගයේ ප්‍රකට පුද්ගලයෙකි.
26. මේ බලය කිසිදා නොයෙදිය යුතුය.

හරහට

1. ක්‍රිස්තුස් වහන්සේ ජීවත් කළ නායකත්වය.
5. කැලේ නායකයා ........... සතෙකි.
7. පරමාණුක ක්‍රමාංකය 80 වන ලෝහමය මූලද්‍රව්‍ය.
8. කුරුණෑගල සිට කි.මී. 11 සහ මහනුවර සිට කි.මී. 31 පිහිටා ඇති නගරය.
11. ශරීරයට අහිතකර මරණය පවා සිදු කරන ද්‍රව්‍ය.
13. පොළොන්නරුව දිස්ත්‍රික්කයේ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකි.
14. දාමය යන්නට සම අරුත්දේ.
15. පණිවුඩයක් දැනුම් දීමට, කාලය හැඟවීමට නාද කළ හැකිය.
18. "පුංචි රෝමය" ලෙස හැඳින්වේ.
21. මහ පොළොව මත සැම දෙයක්ම දෙවියන් විසින් ...... දෑය.
23. සිංහල ජනතාව අතර පවතින කුලයකි. (රා මදින්නන්ගේ කුලය)
25. ආපසු ගෙවීම සඳහා ලබාගන්නා මුදල.
26. "මැතිවරණ කොමසාරිස්" යන වදනට භාවිත වන කෙටි යෙදුම.
27. ගව ආදි සතුන්ගේ ගැහැනු සතා.
28. පැරණි ගිවිසුමේ සමාජ අසාධාරණය පිළිබඳ කතා කළ දිවැසිවරයෙකි.
29. රසදියේ දියවන ලෝහය.

**ගරු චාමික සුදර්ශන නිමනි පියතුමා**
මැසනඩ් ඉංග්‍රීසි අධ්‍යාපන ආයතනය
කටුවපිටිය, මීගමුව.

ප්‍රහේලිකාව සඳහා ඔබගේ පිළිතුරු තැපැල්පතක පමණක් අලවා පහත ලිපිනයට, **2024 සැප්. 30 ට** පෙර තැපැල් කරන්න. ජයග්‍රාහකයන් අතුරින් කුසපත් ඇද තෝරා ගත් **තිදෙනකුට මුදලින් තෑගි පිළිවෙලින්, රු.2000.00, රු.1500.00, රු.1000.00** බැගින් පිරිනැමේ. ***විශේෂ මතක් කිරීමක් - ප්‍රහේලිකාවේ විසඳුම් එවන විට ඔබේ නම, පන්තිය, පාසල, පාසලේ සහ නිවසේ ලිපිනය සඳහන් කර එවන්න.***

**ප්‍රහේලිකා අංක - 81**
**"ළමා භක්ති ප්‍රබෝධනය", අංක 265, ඩීන්ස් පාර, මරදාන, කොළඹ 10.**

## ප්‍රහේලිකා අංක 79 - පිළිතුරු

| | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| 1 සා | න් | 2 කු | 3 ව | රු | | 4 නු | වා | 5 න | |
| මා | | 6 රු | ක් | | 7 අ | මු | | 8 සී | 9 පා |
| 10 න | ළ | ල | | 11 ඌ | | 12 හු | ණු | | පෝ |
| ය | | 13 තා | 14 බෝ | ර් | | න් | | 15 පී | ච් |
| 16 ස | 17 ම | | ග | | 18 පො | රෝ | ව | | චා |
| 19 ම | ං | ස | ල | | | ටි | | 20 ව | ර |
| 21 ය | ස | | 22 ප | ඬු | 23 රු | | 24 තො | ර | ණ |
| | ල | | ත | | 25 ට | ක | ර | | ය |
| 26 සු | කු | මා | ල | | යි | | | | |
| 27 ර | ණ | | | 28 මෙ | ල් | කි | ස | දෙ | ක් |

## ආදරණීය දරුවනී

"ළමා ප්‍රබෝධනය" ට
ඔබගේ ලස්සණ නිර්මාණ,
කවි, ගීත, නිසඳැස්,
කෙටිකතා, ලිපි ආදිය ලැබීමට
අපි බොහොම කැමැත්තෙන් සිටිමු.
ඔබ එවන ඒ නිර්මාණය සමඟ
පන්තිභාර ගුරුතුමාගේ හෝ
ගුරුතුමියගේ
අත්සන ඇතිව අප වෙත එවන්න.

**සංස්කාරක පියතුමා,**
**"භක්ති ප්‍රබෝධනය",**
**265, ඕීන්ස් පාර, මරදාන,**
**කොළඹ 10.**
Email:bhakthi.prabodhanaya@gmail.com

## ප්‍රහේලිකා අංක 79 ජයග්‍රාහකයා

දයාබර දරු දැරියනී,

ප්‍රහේලිකා අංක 79 සම්පූර්ණ කර අප වෙත එවූ සැමටම ස්තුති කරමු. නිවැරදි පිළිතුරු එවූ දරු දැරියන් අතුරින් පහත නම සඳහන් දරුවා ජයග්‍රහණය කර ඇත. සහභාගී වූ සියල්ලන්ටම සුබ පතන අතර ත්‍යාග ලාභියා වෙත ත්‍යාගය යථා කාලයේදී පාසැලේ විදුහල්පතිතුමා හෝ විදුහල්පතිතුමිය මගින් ලැබෙන බව කරුණාවෙන් සලකන්න.

**නිවැරදි පිළිතුර එවා ජයග්‍රහණය කළ දරුවා**

- පළමු ස්ථානය - ෂෙහාරා අංජලී පෙරේරා, 10 ශ්‍රේණිය, යහපත් එඬේරාගේ කන්‍යාරාමය, පානදුර.
- දෙවන ස්ථානය - ජයග්‍රහණය කර නැත.
- තෙවන ස්ථානය - ජයග්‍රහණය කර නැත.

## භක්ති ප්‍රබෝධනය ඉදිරි තේමා

**2024 නොවැම්බර් / දෙසැම්බර් - "කඳුළයි සිනහවයි"**
(නොවැ. - දෙසැ. කලාපය සඳහා ඔබ එවන ලිපි සැප්තැම්බර් 15 ට පෙර අප වෙත එවන්න.)
**2025 ජනවාරි / පෙබරවාරි - "ආගම යනු ......."**
(ජනවාරි - පෙබරවාරි කලාපය සඳහා ඔබ එවන ලිපි නොවැම්බර් 15 ට පෙර අප වෙත එවන්න.)

# කතෝලික ධර්මය
## ආදර්ශ ප්‍රශ්න පත්‍රය - II වන කොටස
## අ.පො.ස. (සා.පෙළ) විභාගය - 2024

ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

1. 1. කතෝලික දේව වන්දනාවේ කේන්ද්‍රස්ථානය හා අග්‍රස්ථානය කුමක්ද?
   2. දේව ප්‍රසාද නිධානයන්ගේ දේව ප්‍රසාද නිධානය කුමක්ද?
   3. ප්‍රථම වරට පූප හා මිදි යුෂ ගෙන දෙවියන්වහන්සේට ඔප්පු කළ පූජකයා කවුද?
   4. ඉතාලියේ ලන්චියානෝ නුවර දිව්‍ය සත්ප්‍රසාදීය ප්‍රාතිහාර්ය සිදුවූ දේවස්ථානය කැපකර ඇති මුනිතුමා කවුද?
   5. 1978 දී නාසා ආයතනය ටියුරින් නුවර පැවැත් වූ පර්යේෂණය කුමක්ද?
   6. දෙවියන්වහන්සේ විසින් ආරොන්ව තෝරා ගන්නා ලද්දේ ඇයි?
   7. දිව්‍ය සත්ප්‍රසාදය හා පූජකවරයා යන සක්‍රමේන්තු දෙක ස්ථාපිත කරන ලද්දේ කවදාද?
   8. පුරාණ ගිවිසුමේ යාග පූජා සඳහා යොදා ගනු ලැබුවේ මොනවාද?
   9. ඊශ්‍රායෙල් පුදපූජාවල ප්‍රධාන කොටස් දෙක නම් කරන්න.
   10. නව ගිවිසුමේ පාස්කු යාගයේ බැටළු පෝතකයාණන් වූයේ කවුද?

2. 1. පුරාණ ගිවිසුමේ යාග පැවැත්වීමේ පරමාර්ථ 02ක් ලියන්න.
   2. දවන පූජා වර්ග 03 ක් නම් කරන්න.
   3. ඔබට අන් අය වෙනුවෙන් යාග විය හැකි අවස්ථා 05ක් ලියන්න.

3. 1. ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි.) පියතුමා ඝාතනයට ලක්වන විට සේවය කළේ කිනම් පදවියේ ද?
   2. ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි.) පියතුමා විසින් දිළිඳු ජනතාව මුල් කරගෙන කරන ලද ව්‍යාපාරවල ඉස්මතු වූ කරුණු 03ක් ලියන්න.
   3. ගරු මයිකල් රුද්‍රිගු (නි.ම.නි.) පියතුමා යොමු වූ ප්‍රධාන ක්ෂේත්‍ර 05ක් ලියන්න.

4. 1. ප්‍රසාද ස්නාපනයේදී භාවිත කරන සංකේත 02ක් ලියන්න.
   2. ප්‍රසාද ස්නාපනය තුළින් කිතුනුවා ලබන ත්‍රිවිධ කැඳවීම් මොනවාද?
   3. ආත්මික මව්පියන් වීමට තිබිය යුතු සුදුසුකම් මොනවාදැයි කරුණු 05ක් ඇසුරින් විස්තර කරන්න.

5. 1. සුවදානයේ දේව ප්‍රසාද නිධාන 02ක නම් කරන්න.
   2. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය හඳුන්වන වෙනත් නම් 03ක් ලියන්න.
   3. සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලබන පුද්ගලයා අනුගමනය කළ යුතු පියවර මොනවාද?

## පිළිතුරු

1. 1. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ 2. දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ 3. පූජක රජතුමෙකු වූ මෙල්කිසදෙක්
   4. ශුද්ධ වූ ලෙගොන්ෂියන් මුනිතුමා 5. ශ්‍රී සළුව පිළිබඳ පර්යේෂණය
   6. පාරාවෝ ඉදිරියට යන මොසෙස්තුමාගේ තනියට යැවීම සඳහා
   7. මහ බ්‍රහස්පතින්දා 8. ආහාරපාන හා සතුන් 9. දවන පූජා/නොදවන පූජා
   10. ක්‍රිස්තුන් වහන්සේ

2. 1. පව්වලට වන්දි ගෙවීමට/දෙවියන් වහන්සේ සමඟ යහපත් අඛණ්ඩ සම්බන්ධතාවක් පවත්වා ගැනීමට.
   2. සම්පූර්ණයෙන් දවන පූජා /සහභාගීකමේ පූජා /පාප පූජා / වන්දි ගෙවීමේ පූජා.
   3. වැරදි මඟ යන අය හරි මඟට ගැනීම/රෝගීන්ට උදවු කිරීම/මරණ ගෙවල්වලට උදවු උපකාර කිරීම/ අසරණ අයට උදවු කිරීම/ අධ්‍යාපන ලබන අයට උදවු කිරීම

3. 1. බදුල්ල පදවියේ
   2. වතු කම්කරුවන් උදෙසා හඬක් නැගීම /සාමය හා සාධාරණත්වය පිළිබඳ හඬ නැගීම / ප්‍රජාවගේ මානව අයිතිවාසිකම් හා මානව සංවර්ධනය වෙනුවෙන් හඬනැගීම.

   3. 1. තරුණ ප්‍රශ්න වෙනුවෙන් ඉදිරිපත් වීම. සාධාරණත්වය පදනම් වූ සමාජයක් ගොඩනැගීම
      2. ජන වන්දනාව දේශීකරණය කිරීම.
      3. ආර්ථික හා සමාජීය වශයෙන් දිළිඳු ජනතාවගේ ගැටලු වලට විසඳුම් සෙවීම.
      4. පූජක දිවිය සේවක පූජකත්වය වෙත ගෙන යාම.
      5. අනිකුත් ආගම් අතර සුහදතාව හා සහයෝගීතාව ගොඩනැගීම.

4. 1. ජලය/සුදු වස්ත්‍රය/ ආලේප කිරීම/ පාස්කු ඉටි පහන
   2. රාජකීය(එඬේරික)/ පූජක/දිවැසිවර
   3. 1. ආරම්භක දේව ප්‍රසාද නිධාන ලබා තිබීම.
      2. අවු.16 ඉක්මවා ගිය කෙනකු වීම.
      3. දරුවාගේ දෙමාපියන් නොවිය යුතුය.
      4. ශුද්ධ වූ සභාව විසින් නියම කරන ලද කිසිම දඬුවමකට යටත් නොවූවකු විය යුතුය.
      5. දරුවාගේ දෙමාපියන් විසින් අනුමත කරනු ලැබුවකු විය යුතුය.

5. 1. සමගි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය / රෝගීන්ගේ ආලේප කිරීමේ දේව ප්‍රසාද නිධානය
   2. සිත් හැරීමේ දේව ප්‍රසාද නිධානය / පශ්චාත්තාපයේ දේව ප්‍රසාද නිධානය / පාපෝච්චාරණය / සමාව දානය කිරීමේ දේව ප්‍රසාද නිධානය
   3. ආත්ම සෝදිසියේ යෙදීම / කළ පාපවලට මනස්තාප වීම / නැවත ඒ පව් නොකිරීමට සිතා ගැනීම / සමඟි සන්ධානයේ දේව ප්‍රසාද නිධානය ලැබීමට / දෙන දඬුවම් හා පශ්චාත්තාප ක්‍රියා ඉටු කිරීම.

**ජේ. ඒ. එල්. ශ්‍රීමති සිල්වා මෙනවිය.**
විදුහල්පතිනිය - මිනු/ පහළ මඩම්පැල්ල කනිෂ්ඨ විද්‍යාලය - කටාන.

# නව ගිවිසුම හා සුබාරංචි ලේඛන ගතවීම V

## අ.පො.ස. (උ.පෙළ) ක්‍රිස්තියානි ධර්මය/ශිෂ්ටාචාරය සඳහා අත්වැලක්

## නව ගිවිසුම් සමයේ ජුදා ආගමික කණ්ඩායම්

පලස්තීනයේ ජුදාවරුන් අතර විසූ ආගමික කණ්ඩායම් කිහිපයක් පසුගිය ලිපියෙන් සාකච්ඡා කර ඇත. මේ ලිපියෙන් සාකච්ඡා කෙරෙන්නේ සදුසිවරු, සෙලට්වරු, එසේනිවරු විසිරි ගිය ජුදාවරු යන ආගමික කණ්ඩායම් ය.

### සදුසිවරු

මොවුන් දාවිත්, සලමොන් වැනි රජවරුන්ගේ යුගයේ ජීවත් වූ, පූජක මෙහෙවරෙහි යෙදුණ සාදොක් නැමැත්තාගේ වංශයෙන් ආරම්භ වී ඇත (2 සාමුවෙල් 8/17). ඔවුන් ධනවත්, ඉඩම් හිමි පිරිසකි. දේශපාලන වාසි ලැබීම වෙනුවෙන් රාජ්‍ය පාලකයන් හා එක්ව කටයුතු කර ඇත. ශු. ලියවිල්ලේ ඇති පංච පුස්තකය පමණක් ඔවුන් පිළිගත් අතර වෙනත් කිසිදු ඉගැන්වීමකට එකඟ නොවූහ. පංච පුස්තකයේ නීතිරීති, දඬුවම් කෙරෙහි තදින් ක්‍රියා කළහ. ජුදා මන්ත්‍රණ සභාව වූ සෙන්හෙඩ්‍රින් හි සාමාජිකයන් වූ අතර උත්තම පූජකයා තෝරා පත්කර ගන්නා ලද්දේ සදුසිවරුන් අතුරිනි.

### ආගමික ලක්ෂණ

මරණයෙන් පසු උත්ථානය, අවසාන විනිශ්චය, මෙසියස් තුමාගේ පැමිණීම, ආත්මයේ අමරණීයත්වය සහ දේවදූතයන් යනාදිය පිළිනොගනිති. වත්පිළිවෙත් ඉටු කිරීමට ජෙරුසලෙම් දේව මන්දිරය කේන්ද්‍රස්ථානය කොට සැලකූහ. පලස්තීනයේ වාචික සම්ප්‍රදායෙන් ගොඩනැගුණු මිෂ්නා නීතිය පිළිනොගත් අතර ලිඛිත නීතිය පමණක් පිළිගෙන ඇත. ක්‍රිස්තුස් වහන්සේව මරණීය දණ්ඩනයට නියම කිරීමට මොවුන්ද වගකිය යුතු පිරිසකි. මන්ද, රෝම පාලකවරුන්ට ඉතා පක්ෂපාතව මොවුන් කටයුතු කර ඇත.

### සෙලට්වරු

සෙලට්වරුන්ට අන්තවාදින් යැයිද පවසති. ක්‍රි.ව. 6 පමණ කාලයේදී ගලීලයේ ජීවත් වූ පුද්ගලයෙකි ජුදස්. ඔහු සෙලට්වරුන්ගේ නිර්මාතෘ ය. අන්ත ජාතිවාදී වූ මොහු සහ ඔහුගේ පිරිස ඔවුන් තුළ රෝමානු අධිරාජයාගේ පාලනය පිළිගැනීමට අකමැති වූවා පමණක් නොව රෝමානු පාලනය පලස්තීනයෙන් තුරන් කිරීමට මූලිකව කටයුතු කළේය. ඔහු සහ කණ්ඩායම රෝමානු අධිරාජයාට විරුද්ධව කැරැල්ලක් මෙහෙය වූහ. එහි අරමුණ වූයේ රෝමවරුන්ගෙන් නිදහස් වූ පලස්තීනයත් සහ යුදෙව් චින්තනය මව්බිම තුළ ස්ථාපිත කිරීමයි. ඔවුන්ගේ අපේක්ෂාව වූයේ මෙසියස් තුමා පැමිණ රෝමවරුන් සමග සටන්කොට ඔවුන් පලවා හැර දමනු ඇති බවයි. ඒ නිසා කල්තියාම මෙසියස්ගේ පැමිණීම බලාපොරොත්තු වූ පිරිසක් ලෙස මොවුන්ව හඳුන්වා දිය හැකිය. ඔවුන්ගේ සටන දේව ජනතාව ආරක්ෂා කර ගැනීම වෙනුවෙනි.

### රෝමානු අධිරාජ්‍යයාට විරුද්ධවීම

රෝමවරුන් ජුදයන්ගේ හිස මත අධික බදු බර පැටවීම හේතුවෙන් මොවුන් රෝමවරුන්ට විරුද්ධ විය. රෝම නිලධාරීන් සහ අයකැමියන් ජුදා ජනතාවගෙන් එකතු කරන බදු මුදල සැම විටම රෝම අධිරාජයාට දිය යුතුය. සෙලට්වරු එයට විරුද්ධව ඒ මුදල් කොල්ලකෑමට පෙලඹුණු හෙයින් මොවුහු මංකොල්ලකරුවන්, මංපහරන්නන්, සොරුන් ලෙස රෝමවරුන් විසින් හංවඩු ගසන ලදහ. මෙසියස් තුමාගේ පැමිණීම බලාපොරොත්තු වුණ නිසා ජුදාවරුන් මොවුන්ව හැඳින්වූයේ මෙසියා කණ්ඩායම ලෙසය. රෝම අධිරාජයාට විරුද්ධව කටයුතු කිරීම මොවුන් සලකන ලද්දේ ශුද්ධවූ අරගලයක් ලෙසින් ය. මන්ද ඔවුන්ගේ චින්තනය වූයේ දෙවියන්වහන්සේ පමණක් රජ කරන බවයි. ක්‍රි.ව. 70 දී ජුදා රෝම කැරැල්ල යටතේ රෝමවරුන්, ඔවුන් අතින් අධික පරාජයකට මුහුණ දීම, මසදා නගරය අත්පත් කරගෙන තම පාලනයට නතු කර ගෙන ඇත. ජුදාස් ඉක්කාරියොත් මෙන්ම, ක්‍රිස්තුස් වහන්සේ සමග ඇණ ගැසීමට නියම ව සිටි පසුව නිදහස් වූ බරබ්බාස් මොවුන්ගේ කණ්ඩායමේ අය වේ.

**ඒසේනිවරු**

ක්‍රි. පූ. 200 දී සිව්වන ඇන්ටියෝකස් එපිපානස්ට විරුද්ධව මකබි කැරැල්ල ඇති වේ. ඉන් පසුව ඒ කණ්ඩායම ක්‍රිස්තු පූර්ව 152 දී සිරියානු රජවරුන් විසින් උත්තම පූජක තනතුරට ඔවුන්ගෙන් කෙනෙක් පත් කරන ලදී ඉන් සිදු වූයේ එතෙක් ෂාදොක් පරපුරට අයිති වූ උත්තම පූජක තනතුර ඔවුන්ට අහිමි වීමයි. ඒ නිසා ඔවුහු මළ මුහුද අසල කුම්රාන් දූපත් කරා ගොස් කුම්රාන් සමූහය හා සම්බන්ධ වී ජීවත්වූහ. මේ කණ්ඩායම සමග සම්බන්ධතා පැවැත්වූ පුද්ගලයෙකි ස්නාවක ජුවාම්තුමා. ක්‍රි.ව. 70 - 71 අතරතුර ඇති වූ ජුදා - රෝම කැරැල්ල හේතුවෙන් ඒ ආගමික කණ්ඩායම අතුරුදහන් වූ අතර ඇතැමකු ක්‍රිස්තියානි සමූහය හා එක්වී ඇත. ශුද්ධ ලියවිල්ලේ එසේනිවරුන් ලෙස ජන කණ්ඩායමක් පෙන්වා දී නැත. ඒ පිරිස සම්බන්ධ තොරතුරු විරලය.

**විසිරී ගිය ජුදාවරුන්**

විවිධ කාලවකවානුවල පලස්තීනය විවිධ අධිරජවරුන් විසින් යටත් කරගෙන පාලනය කරන ලදි. උදා : අසිරියාව, බැබිලෝනිය, ග්‍රීක්වරු හා රෝමවරු ඒ අවස්ථාවලදී ජුදාවරුන්ව වෙනත් රටවල්වලට විප්‍රවාසගත කළෝය. තවත් සමහරු පීඩනයන්ට මුහුණ දීමට නොහැකිව පලස්තීනය හැර දමා වෙනත් රටවල් කරා ගියහ.

එසේම රැකියාව සඳහා ද බැහැර වූ පිරිස් වෙති. මේ අය වෙනත් රටවල ස්ථිර ලෙස පදිංචි වූහ. නැවත මව්බිමට පැමිණියේ නැත. ඔවුන් බොහෝ විට භාවිත කළ භාෂාව ග්‍රීක් බසය. ඒ නිසා පලස්තීනයේ ජීවත්වූ ජුදාවරුන් මොවුන්ව සලකන ලද්දේ දෙවන පන්තියේ ජුදාවරුන් ලෙසය. පෙන්තකොස්ත දිනයේදී ශුද්ධවූ පේදුරු තුමාගේ දේශනය අසා මොවුන් අතුරින් 3000 කට අධික පිරිසක් කිතු දහම වැළඳ ගත්හ. මේ ආගමික කණ්ඩායමේ අය බොහෝ තැන්වලට වී පාවුලු තුමාට විරුද්ධව ගැටුම් ඇති කරගෙන ඇත. වර්තමානයේද ඒ පිරිස් කුඩා ජුදා සංඝ ලෙස විවිධ රටවල ජීවත් වෙති.

සටහන ශාස්ත්‍රපති එස්. හේමාල් පෙරේරා



# කුස ගින්නට නොව හද ගින්නටයි

*(ශු. ජොහාන් 6:24-27 සුවිශේෂ පාඨය ඇසුරින් නිර්මාණය කොට ඇත)*

නැති වූ ගුරා සොයන මනුසත් රැළ
ඔරුවල නගිති ගඟ දිගේ කපර්නාවුමට
එගොඩ සිටින ජේසු ඇත ඉදන් දැක
ඇසුවා බොහෝ ප්‍රශ්න වැලක් ගිය ඔරුවෙන් බැස

හාස්කමට නොව ආවේ රොටී කන්න බලා
ආ දනන්ගේ සිතුම් පැතුම් දැනගත් මේ ගුරා
නැතිවෙන ආහාරය ගැන හඬන දනන් හටා
කිව්වා ඔහු සදාතන බොදුන සොයනු කියා

හැම ඉරිදම අප යන්නේ පල්ලි යනවා කියා
දිව්‍යයාගේ සැබෑ අරුත අපි දනිමු සිතා
සදාතන භෝජනයෙන් පිරෙන ලෙසට පතා
ලබන ඉරිදා පල්ලි යන්නේ නව දිවියක් සොයා

**අනුෂ්ක රනික්**
සා. ජෝසප් නි.ම.නි. දෙව්සත්හල
කොහුවල

# 2024 භක්ති ප්‍රබෝධන ජුබිලි තරගයේ ජයග්‍රාහකයෝ

*125 වන ජුබිලි සංවත්සරය නිමිත්තෙන් සංවිධානය කළ රචනා, කෙටිකතා, කාව්‍ය හා චිත්‍ර තරග ප්‍රතිඵල*

| ස්ථානය | නම | වසර | පාසල/දහම් පාසැල (ද. පා.) |
|---|---|---|---|
| | **චිත්‍ර තරගය (1 වසරේ සිට 5 වසර දක්වා)** | | |
| 1 | අයුෂි පන්නියවිදානගේ | 3 | සා. ත්‍රිත්ව සභාරාමය, කොළඹ 07. |
| 2 | වෙනුෂි පන්නියවිදානගේ | 4 | සා. ත්‍රිත්ව සභාරාමය, කොළඹ 07. |
| 3 | එලියාදුර ක්ලේයාර් ශෙනුලි ක්‍රිෂේල් ද සොයිසා | 3 | ලොයොලා විදුහල, බෝපිටිය. |
| | **රචනා තරගය (6,7,8 වසර දක්වා)** | | |
| 1 | සෙනෙල්යා මෙන්ඩිස් | 8 | ශු. පවුලේ සභාරාමය, බම්බලපිටිය. |
| 2 | එම්. කෙවින් ක්‍රිස්ටියන් | 7 | සා. අන්තෝනි ද. පා. මහවත්ත/ දලාසල් විදුහල, මෝදර |
| | **රචනා තරගය (9,10,11 වසර දක්වා)** | | |
| 1 | එම්. මේරි ජෙනිකා | 11 | සා. අන්තෝනි දහම් පාසල මහවත්ත/සා. අන්තෝනි බාලිකා මධ්‍ය මහ විදුහල මෝදර. |
| 2 | අෂේරා ෂෙනුරි ප්‍රනාන්දු | 10 | කාර්මෙල් බාලිකා මහ විද්‍යාලය, හලාවත. |
| 3 | හිරුණි කෞෂිකා අබේකෝන් | 11 | සා. අන්තෝනි දහම් පාසල, මහවත්ත /සා. අන්තෝනි බාලිකා මධ්‍ය මහ විදුහල, මෝදර. |
| | **රචනා තරගය (12 සහ 13 වසර දක්වා)** | | |
| 1 | බුද්ධිකා සඳරුවන් | 13 | සා. ඇලෝසියස් දේවසත්හල, බොරැල්ල. (සා. මරියා මහ විදුහල, මීගමුව.) |
| 2 | එම්. මලීෂා කාවින්දි සිල්වා | 13 | යහපත් එඬේරාගේ සභාරාමය, පානදුර. |
| 3 | වී. රිද්මා නිමාෂි සෝවිස් | 13 | ශු. පවුලේ සභාරාමය, කළුතර. |
| | **කෙටිකතා තරගය (විවෘත, පාසල් දරුදැරියන්)** | | |
| 1 | කේ. ඒ. ඩී. හෙක්මී සුබෝධනී | 11 | සා. අන්තෝනි දහම් පාසල, මහවත්ත /සා. ජෝශප් බාලිකා මහ විදුහල, ග්‍රෑන්ඩ්පාස් |
| 2 | ජේ. ඒ. ප්‍රවීන් එස්. අප්පුහාමි | 11 | ක්‍රිස්තුරාජ ජාතික පාසැල, කුඩැල්ල. |
| 3 | චමිදි උත්තරා ගම්ආරච්චි | 12 | ශ්‍රීපාලි විද්‍යාලය, හොරණ. |
| | **කෙටිකතා තරගය (විවෘත, වැඩිහිටි)** | | |
| 1 | වී. එම්. කැතරින් ගුණවර්ධන | | 88/ඒ, දේවාල පාර, නාත්තන්ඩිය. |
| 2 | චතුරිකා කස්තුරිආරච්චි | | 21/1, සුසානභූමිය පාර, එගොඩඋයන, මොරටුව. |
| 3 | කැලිස්ටස් ජයමාන්න | | 548/2, හීන්කෙන්ද, රාගම. |
| | **කාව්‍ය නිසඳැස් තරගය (විවෘත, වැඩිහිටි)** | | |
| 1 | වී. එම්. කැතරින් ගුණවර්ධන | | 88/ඒ, දේවාල පාර, නාත්තන්ඩිය. |
| 2 | ශාන්ත කටුකුරුන්ද | | 19, වැව පාර, කටුකුරුන්ද, කළුතර දකුණ. |
| 3 | පස්කල් ජයමාන්න | | 354, පරණඅම්බලම, උස්වැටකෙයියාව. |

**අප ඔබට පැවසූ අයුරින්ම ප්‍රථම, දෙවන, තෙවන ස්ථාන සඳහා පිළිවෙලින් රු. 20,000, රු. 15,000, රු. 10,000 මුදලක් ත්‍යාග වශයෙන් ප්‍රදානය කරන අතර සහතික පතක් ද හිමිවේ.**




මිල රු.100/=
(සහන මිල)

"භක්ති ප්‍රබෝධනය" සංස්කාරක ගරු එමාඩ් දල්පතාදු නි.ම.නි. පියතුමන් විසින් කොළඹ කතෝලික මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී. පුවත් පතක් ලෙස තැපැල් හලේ ලියාපදිංචි කර ඇත. DOP/NEWS/01/2024